# ප්‍රගති වාර්තාව 2021

## ධීවර අමාත්‍යාංශය

මාලිගාවත්ත, කොළඹ 10

# අන්තර්ගතය

| | පිටු අංකය |
|---|---|
| 1. ධීවර අමාත්‍යාංශය | 03 - 24 |
| 2. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 25 - 48 |
| 3. නෝත්සී ලිමිටඩ් | 49 - 66 |
| 4. ධීවර අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති | 67 - 82 |

# ධීවර අමාත්‍යාංශය

## දැක්ම

ධීවර හා ජලජ සම්පත් සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ දකුණු ආසියානු කලාපයේ ප්‍රමුඛයා වීම.

## මෙහෙවර

වර්තමාන හා අනාගත පරපුරේ යහපත උදෙසා ධීවර හා ජලජ සම්පත් භාවිතය කළමනාකරණය කිරීම.

## ප්‍රතිපත්තිමය අරමුණු

- විද්‍යානුකූල පදනමකින් යුත් **(science based)** තොරතුරු භාවිතා කරමින් සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම.
- ධීවර කර්මාන්තය කලාපීය හා ජාත්‍යන්තර බැඳීම් වලට අනුකූල වීම.
- සමුද්‍රීය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.
- ජලජීව්වගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.
- පසු අස්වනු හානි අවම කිරීම සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම.
- ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම.
- අපනයන ආදායම් ඉහළ නැංවීම.
- විනෝදාත්මක ක්‍රියාකාරකම්, රැකියා හා ව්‍යාපාරික සංවර්ධනය සඳහා පවතින අවස්ථා ඉහළ නැංවීම.
- ධීවර ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- සාගර, කිවුල් දිය හා අභ්‍යන්තර ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම
- ප්‍රතිපත්ති හා වැඩසටහන් විධිමත්ව සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- ජාතික ජලජ සම්පත් සංවර්ධනය හා තිරසාර ලෙස භාවිතා කිරීම
- නිෂ්පාදන  අන්තර්ජාතික තත්ත්වයට උසස් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් කරමින් මත්ස්‍ය නිෂ්පාදන දරාගත හැකි මිලකට සැපයීම
- මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැලසීම

| ධීවර අංශයට දායකත්වය සපයන ආයතන හා අරමුණු | |
|---|---|
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව<br>(DFAR) | **අපේක්ෂිත අරමුණු** - ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය, සංවර්ධනය හා සංරක්ෂණය<br><br>**වගකීම** කලාපීය **සහ** අන්තර්ජාතික සම්මුතීන්ට හා රෙගුලාසි වලට අනුකූලව 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත ක්‍රියාත්මක කිරීම **සහ** ධීවර කළමනාකරණ කටයුතු හා නෛතික විධිවිධාන යාවත්කාලීන කිරීම. |
| නෝර්ත්සී ලිමිටඩ් | **අපේක්ෂිත අරමුණු** - දේශීය ධීවර කාර්මිකයින් ගේ අවශ්‍යතා පිරිමසමින් උසස් ප්‍රමිතියකින් යුත් මාළු දැල් හා ධීවර ආම්පන්න සැපයීම<br><br>**වගකීම** - 2007 අංක 7 දරණ නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරමින් පිහිටුවන ලද මාළු දැල් නිෂ්පාදනය කරන සමාගමකි |

## විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධනය, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

| | |
|---|---|
| ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය<br>(NARA) | **අපේක්ෂිත අරමුණු** - ජලජ සම්පත් පිළිබඳ පර්යේෂණ, ජලජ සම්පත් සංවර්ධනය සංරක්ෂණය හා කළමනාකරණය.<br><br>**වගකීම** 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් ජලජ සම්පත් හා ජලජීවී වගාව ධීවර තාක්ෂණය, මත්ස්‍ය හා පසු අස්වනු තාක්ෂණය, පාරිසරික අධ්‍යයනය, සමුද්‍ර ජීව විද්‍යාව,ජල **ශාස්ත්‍රය** හා සාගර අධ්‍යයන කටයුතු සිදුකිරීම. |
| ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය<br>**(NAQDA)** | **අපේක්ෂිත අරමුණු** - වගා කිරීම මත පදනම් වූ මිරිදිය ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව ප්‍රවර්ධනය, කළමනාකරණය සහ නියාමනය<br><br>**වගකීම** 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනත යටතේ ස්ථාපිත කරන ලද මෙම ආයතනය මගින් මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාවට අවශ්‍ය බීජ සැපයීම හා ව්‍යාප්ති සේවය ලබාදීම, මිරිදිය හා ජලජීවී වගා කටයුතු අධීක්ෂණය, ජලජීවී වගා පුහුණු කටයුතු සැපයීම. |
| ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව<br>**(CFHC)** | **අපේක්ෂිත අරමුණු** - ධීවර වරායන්, නැංගුරම්පොළවල් සැලසුම් කිරීම, ඉදිකිරීම හා පවත්වාගෙන යාම.<br><br>**වගකීම** 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ මෙම ආයතනය මගින් වර්තමානයේ ධීවර වරායන් 20 ක් හා නැංගුරම්පොළවල් 58 ක් පවත්වාගෙන යාම. |
| ලංකා ධීවර සංස්ථාව<br>**(CFC)** | **අපේක්ෂිත අරමුණු** - මත්ස්‍ය නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට උපරිම වාසි සැලසෙන අයුරින් මත්ස්‍ය වෙළඳපොළ සඳහා දායක වීම.<br><br>**වගකීම** 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් මාළු මිලදී ගැනීම හා විකිණීම, අයිස් නිපදවීම හා විකිණීම, ශීතාගාර පහසුකම් පවත්වාගෙන යාම හා මත්ස්‍ය අතුරු නිෂ්පාදන විකිණීම සිදුකරයි. |
| සීමාසහිත සීනෝර් පදනම | **අපේක්ෂිත අරමුණු** ධීවර කර්මාන්තයට අදාල වන්නාවූ යෙදවුම් හා සැපයුම් ලබාදීම.<br><br>**වගකීම** 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති මෙම ආයතනය මගින් ෆයිබර් ග්ලාස් ආශ්‍රිත උපකරණ හා ඔරු, බෝට්ටු නිෂ්පාදනය කරන අතර අනිකුත් සියළුම ධීවර ආම්පන්න අලෙවිය සිදු කරයි. |

# 01
# ජාතික ආර්ථිකයේ වර්ධනයට ධීවර අංශයේ දායකත්වය









## 2021 වසරේ ධීවර අංශයේ සමස්ත ප්‍රගතිය

ධීවර කර්මාන්තය තුල අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ධීවර ක්ෂේත්‍රයට අදාල වූ ප්‍රතිපත්ති සමුදාය සාක්ෂාත් කර ගැනීම උදෙසා 2020 වසරේ ගනු ලැබූ ප්‍රයත්නයන් 2021 වර්ෂය තුල තවදුරටත් ශක්තිමත් කරමින් අඛණ්ඩව අධිෂ්ඨාන පූර්වකව ඉදිරියට ගෙන යාමට ගරු අමාත්‍යතුමාගේ හා ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ නායකත්වය සමඟ ධීවර අමාත්‍යාංශයේ මෙහෙයවීම තුලින් දියත් කල සාර්ථක ක්‍රියාදාමයන් මඟින් කෝවිඩ් වසංගත බලපෑම හමුවේ වුවද, මත්ස්‍ය නිෂ්පාදනය, ධීවර සමාජ සංවර්ධනය, ධීවර වරාය ඉදිකිරීම හා නවීකරණය මෙන්ම මත්ස්‍ය අපනයන යන කාර්යයන්හි සාර්ථකත්වයක් ලබාගැනීමට හැකිවීම ප්‍රශංසාත්මක ලෙස සඳහන් කළ හැක.

ඉහත ක්‍රියාදාමයේ ප්‍රතිඵල ලෙස 2021 ජනවාරි - සැප්තැම්බර් කාල පරිච්ඡේදය තුල කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තයට අදාල මත්ස්‍ය නිෂ්පාදනය පිළිවෙලින් මෙ.ටො 244,915 සහ මෙ.ටො 76,660 ක දායකත්වයක් ලබාදී ඇත. මේ අනුව සමස්ථ මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 321,575 කි.

මත්ස්‍ය පරිභෝජනය මහජනතාවගේ පෝෂණ මට්ටම හා යහපත් සෞඛ්‍ය තත්ත්වයන් වර්ධනය සඳහා ප්‍රෝටීන් සපයන මූලාශ්‍රයකි. ඒ අනුව 2020 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදයේ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 38.4 කි. එම ප්‍රමාණය 2021 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදයේදී දිනකට ග්‍රෑම් 36.7 ක් ලෙස පවත්වා ගැනීමට හැකියාව ලැබී ඇති අතර, අමාත්‍යාංශය දැනට දියත් කොට ඇති ක්‍රමෝපායන් තුලින් මෙම තත්ත්වය තවදුරටත් ඉදිරි කාලයේදී වර්ධනය කරගැනිමට අපේක්ෂිතය.

2021 ජනවාරි - සැප්තැම්බර් කාලපරිච්ඡේදයේ මත්ස්‍ය අපනයන වර්ධනය 2020 වර්ෂයේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව 14.2 % ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම වර්ෂය නිමාවන විට මෙම තත්ත්වය තවදුරටත් වර්ධනය කරගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වන අතර විශේෂයෙන් විදේශ මුදල් සංචිතයේ වර්ධනයට මෙම මත්ස්‍ය අපනයන තුලින් ලැබෙන දායකත්වය ප්‍රශංසාත්මකව සඳහන් කල යුතුය.

එසේම, ධීවර අමාත්‍යාංශ විෂය පථය යටතේ ඇති අනිකුත් ආයතනවල සහභාගීත්වයෙන් දියත් කොට ඇති ධීවර වරාය නැංගුරම්පල ව්‍යාපෘතිය හා කලපු පවිත්‍රකරණ ව්‍යාපෘතිය උදෙසා අමාත්‍යාංශය විසින් සපයන ලද අඛණ්ඩ මූල්‍ය දායකත්වය තුලින්, නව ධීවර වරායන් කිහිපයක් ඉදිකිරීමට හා පවතින ධීවර වරායන් කිහිපයක නවීකරණ කටයුතු සිදුකිරීමේ උප ව්‍යාපෘතීන් දියත් කරන ලද අතර, ඒ අතුරින් නව ධීවර වරායන් හා නවීකරණය කරන ලද ධීවර වරායන් කිහිපයක වැඩ කටයුතු දැනටමත් නිමාකොට ඇති අතර තවත් ධීවර වරායන් කිහිපයක වැඩ කටයුතු නිමාකිරීමට ආසන්නව පවතී.

මෙම තත්ත්වය අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍ය දැක්ම ප්‍රකාශනයේ **"ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය ඉහළ නැංවීම සඳහා මහා පරිමාණ සහ බහුදින ධීවර යාත්‍රා නැවැත්වීමට හැකිවන ආකාරයට දැනට පවතින සියලු ධීවර වරාය නවීකරණය කරන අතර අවශ්‍යතා අනුව අලුතින් ඉදිකිරීමට පියවර ගනු ලැබේ."**හා **"ලංකාවේ සියලු ධීවර වරායන්, ජැටි සහ මාළු ගොඩබෑමේ ස්ථාන නවීන සන්නිවේදන පහසුකම්, ඉන්ධන සැපයීම් සහ සනීපාරක්ෂක**

**පහසුකම් ආදියෙන් සමන්විත මධ්‍යස්ථාන බවට පත් කෙරේ."** යන ප්‍රතිඥාවන් සඵල කරගැනීම උදෙසා අමාත්‍යාංශය විසින් දියත් කරන ලද ක්‍රියාදාමයන් රාශියක සාර්ථකත්වය නිරූපණය කරන්නකි.

එසේම, අභ්‍යන්තර ධීවර කර්මාන්තයේ වර්ධනය උදෙසා මත්ස්‍ය ඇඟිල්ලන් අභ්‍යන්තර ජලාශ වල තැන්පත් කිරීම, ධීවර කර්මාන්තයට අවශ්‍ය නව තාක්ෂණය හඳුන්වාදීම, ධීවර ප්‍රජාව බලගැන්වීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ධීවර නිවාස ඉදිකිරීම හා අලුත්වැඩියාව, ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්, වෙරළ පුනරුත්ථාපනය හා කළමනාකරණය, මසුන් බෝ කිරීමේ මධ්‍යස්ථාන ඉදිකිරීම හා සංවර්ධනය, ධීවර ගම්මාන සංවර්ධනය කිරීම සහ විශේෂයෙන්ම මත්ස්‍ය පසු අස්වනු හානිය අවම කරගැනීමට අවශ්‍ය පර්යේෂණයන් තවදුරටත් ශක්තිමත් කරලීමට අවශ්‍ය ක්‍රියාදාමයන් රාශියක් ධීවර අමාත්‍යාංශය, රාජ්‍ය අමාත්‍යාංශය හා එහි විෂය පථය යටතේ ඇති අනෙකුත් ආයතන විසින් ක්‍රියාත්මක කර ඇත.

සමස්ථයක් ලෙස අමාත්‍යාංශයේ ක්‍රියාත්මක සැලැස්මෙන් අපේක්ෂිත සාධනීය ප්‍රතිඵල පසුගිය වසරේදී කෝවිඩ් වසංගතය හමුවේ කිසියම් දුරකට සාක්ෂාත් කරගැනීමට බාධාවක් වුවද, 2021 වර්ෂයේදී එම අපේක්ෂිත ක්‍රියාදාමයන් පිළිබඳ මනා අවබෝධයකින් යුතුව අමාත්‍යාංශයේ ක්‍රියාත්මක සැලැස්ම සම්පාදනය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් නිසිපරිදි යොදාගැනීම තුළින්, අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍ය දැක්මේ ධීවර අංශයෙන් අපේක්ෂිත ජනතා අභිලාෂයන් සියලු අභියෝග ජයගනිමින් සාක්ෂාත් කරගැනීමට හැකිවීම ධීවර අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ අධිෂ්ඨාන පූර්වක මෙහෙයවීම සහ අමාත්‍යාංශයේ මනා කළමණාකාරීත්වය හා අධීක්ෂණය උපකාරී වූ අතර සියලු අභියෝග හමුවේ මෙම වසරේදී ලත් සාර්ථකත්වය හා අත්දැකීම් සමුදාය ඉදිරි වර්ෂ වල අතිගරු ජනාධිපතිතුමාගේ ජනතා අභිලාශයන් සාක්ෂාත් කරගැනීමට ඉමහත් රුකුලක් වනු ඇත.





නව වසරේ රාජකාරි කටයුතු ආරම්භ කිරීම

## සමස්ථ මත්ස්‍ය නිෂ්පාදනයේ දායකත්වය

### 1.1 වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදන වර්ධනය කර ගැනීම.

2021 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දිවයිනේ සමස්ථ මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 321,575 ක් විය. මෙහි වැඩි දායකත්වයක් ලබා දී ඇත්තේ වෙරළාසන්න ධීවර කර්මාන්තය තුළිනි. එහි ප්‍රතිශතය 40.3% කි. එසේම පිළිවෙලින් 35.9% ක් ගැඹුරු මුහුදෙන් හා 23.8% ක් මිරිදිය හා ජලජීවී වගාව මඟින් දායකත්වයක් සැපයේ.

### 1.2 කරදිය මත්ස්‍ය නිෂ්පාදනය (වෙරළාසන්න, අක්වෙරළ/ ගැඹුරු මුහුද)



සමස්ථ මත්ස්‍ය නිෂ්පාදනය සඳහා වෙරළාසන්න හා ගැඹුරු මුහුදේ දායකත්වය ක්‍රමානුකූලව වැඩි කර ගැනීමට හැකියාව ලැබී ඇත. 2021 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුල ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය තුලින් මෙ.ටො. 115,315 ක් ද, වෙරළාසන්න ධීවර කර්මාන්තය තුළින් මෙ.ටො. 129,600 ක් ද අස්වැන්නක් ලබාගැනීමට හැකිවූ අතර, සමස්ථ කරදිය අස්වැන්න මෙ.ටො. 244,915 කි.

වගුව 1.2.1 : කරදිය මත්ස්‍ය නිෂ්පාදනය - මෙ.ටො.

| කාලය | ගැඹුරු මුහුද | වෙරළාසන්න | මුළු එකතුව |
|---|---|---|---|
| 2021 ජන- සැප්තැම්බර් | 115,315 | 129,600 | 244,915 |

### 1.3 මිරිදිය හා ජලජීවී වගා නිෂ්පාදනය

2021 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාල පරාසය තුළ සමස්ත මිරිදිය හා ජලජීවීවගා නිෂ්පාදනය මෙ.ටො. 76,660 ක් වූ අතර, සමස්ථ මත්ස්‍ය නිෂ්පාදනය සඳහා මෙහි දායකත්වය 23.8% කි. කාලගුණ තත්ත්වය අයහපත් වූවද, මෙම අංශයේ නිෂ්පාදනය වර්ධනය කර ගැනීමට හැකිවීම විශේෂ කරුණකි.



වගුව 1.3.1 : මිරිදිය හා ජලජ ජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය - මෙ.ටො.

| කාලය | මිරිදිය | ජලජීවී වගාව | ඉස්සන් වගාව | මුළු එකතුව |
|---|---|---|---|---|
| 2021 ජන- සැප්තැම්බර් | 60,640 | 4,600 | 11,420 | 76,660 |

2021 ජූලි 30 වන විට සමස්ථ මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය මිලියන 57.98 ක් වන අතර ඉන් මිලියන 23.71 ක් ජාතික ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මගින් නිෂ්පාදනය කර ඇති අතර, ඉතිරිය ප්‍රජා මූලික මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක, පෞද්ගලික පොකුණු, ජලාශ තුළ දැල්කූඩු හා කොටු භාවිතය මගින් නිෂ්පාදනය කොට ඇත.

2021 ජූලි 30 වන විට සමස්ථ මිරිදිය ඉස්සන් හා පසු කීටයන් නිෂ්පාදනය මිලියන 51.41 ක් විය. ඉන් මිලියන 37.5 ක් ජාතික ජලජීවී වගා මධ්‍යස්ථානය මගින් නිෂ්පාදනය කර ඇති අතර ඉතිරිය නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශයෙන් දායකත්වය ලැබී ඇත.

එසේම සමස්ථ කිවුල් දිය ඉස්සන් පසු කීටයන් නිෂ්පාදනය මිලියන 429.4කි. මේ සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය මිලියන 423.8 ක් විය.

2021 වසරේ දේශීය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමේ අවකාශය පුළුල් කරමින් ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නංවාලීම, රැකියා උත්පාදනය , අපනයන වර්ධනය හා ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරලීම උදෙසා උපරිම දායකත්වය ලබා ගැනීමේ අරමුණින් යුතුව ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් සාම්ප්‍රදායික නොවන මත්ස්‍ය වගා ව්‍යාපෘති රාශියක් විවිධ දිස්ත්‍රික්කයන්හි ක්‍රියාවට නංවා ඇත.

**මත්ස්‍ය නිෂ්පාදනය පිළිබඳ දත්ත**

මත්ස්‍ය නිෂ්පාදනය(මෙ.ටො)

| ධීවර උප අංශ | | 2017 | 2018 | 2019 | 2020 | 2020 (ජන - සැප්) | 2021 (ජන - සැප්) | වෙනස 2021-2020 (%) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ගැඹුරු මුහුදෙන් | 189,720 | 190,350 | 172,910 | 144,370 | 107,770 | 115,315 | 7.00 | 35.9 |
| 2 | වෙරළාසන්න | 259,720 | 249,020 | 242,580 | 182,560 | 143,350 | 129,600 | (9.59) | 40.3 |
| | **මුළු කරදිය** | **449,440** | **439,370** | **415,490** | **326,930** | **251,120** | **244,915** | **(2.47)** | **76.2** |
| 3 | මිරිදිය | 68,500 | 71,020 | 73,230 | 84,310 | 58,810 | 60,640 | 3.11 | 18.9 |
| 4 | ජලජීවී වගා | 8,740 | 8,490 | 10,710 | 10,140 | 8,180 | 4,600 | (43.77) | 1.4 |
| 5 | ඉස්සන් | 4,630 | 8,180 | 6,400 | 7,360 | 4,720 | 11,420 | 141.95 | 3.6 |
| | **මුළු මිරිදිය** | **81,870** | **87,690** | **90,340** | **101,810** | **71,710** | **76,660** | **6.90** | **23.8** |
| | **සමස්ථ නිෂ්පාදනය** | **531,310** | **527,060** | **505,830** | **428,740** | **322,830** | **321,575** | **(0.39)** | **100.0** |

මූලාශ්‍රය: සංඛ්‍යාලේඛන අංශය, ධීවර අමාත්‍යාංශය

## 2021 මාසික මත්ස්‍ය නිෂ්පාදන පිළිබඳ දත්ත

| මත්ස්‍ය නිෂ්පාදනය (මෙ.ටො) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| - | කරදිය මත්ස්‍ය නිෂ්පාදනය | | | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය | | | | |
| | අක් වෙරළ | වෙරළාසන්න හා කලපු | මුළු කරදිය | මිරිදිය | ජලජීවී වගා | ඉස්සන් | මුළු මිරිදිය | සමස්ථ නිෂ්පාදනය |
| **2021** | **115,315** | **129,600** | **244,915** | **60,640** | **4,600** | **11,420** | **76,660** | **321,575** |
| ජනΔ | 13,335 | 14,080 | 27,415 | 6,530 | 350 | 880 | 7,760 | 35,175 |
| පෙබΔ | 10,730 | 17,710 | 28,440 | 6,545 | 305 | 690 | 7,540 | 35,980 |
| මාර්තුΔ | 14,580 | 16,900 | 31,480 | 6,560 | 310 | 430 | 7,300 | 38,780 |
| අප්‍රේල්Δ | 15,910 | 12,710 | 28,620 | 6,680 | 330 | 705 | 7,715 | 36,335 |
| මැයිΔ | 11,410 | 12,950 | 24,360 | 6,670 | 380 | 1,040 | 8,090 | 32,450 |
| ජූනිΔ | 11,010 | 13,100 | 24,110 | 6,705 | 600 | 1,670 | 8,975 | 33,085 |
| ජූලිΔ | 12,190 | 13,640 | 25,830 | 6,760 | 590 | 1,720 | 9,070 | 34,900 |
| අගෝΔ | 13,770 | 13,280 | 27,050 | 7,010 | 845 | 2,540 | 10,395 | 37,445 |
| සැප් Δ | 12,380 | 15,230 | 27,610 | 7,180 | 890 | 1,745 | 9,815 | 37,425 |

මූලාශ්‍රය: සංඛ්‍යාලේඛන අංශය, ධීවර අමාත්‍යාංශය

## 1.4. ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වැඩි කර ගැනීම.

මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම තුළින් ශ්‍රී ලාංකික ජනතාවගේ පෝෂණ ඌණතාවයන් අවම කර මන්දපෝෂණයෙන් තොර සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කර ගැනීමට මග පාදයි.



2020 වසරේ ඒකපුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 38.4 ක් වූ අතර, පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ 2021 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුල ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 36.7 ක් ලෙස වාර්තා වී ඇත. මෙම ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය සඳහා දේශීය කරදිය හා මිරිදිය නිෂ්පාදන මෙන්ම ආනයනය කරන ලද මත්ස්‍ය නිෂ්පාදනද දායකවී ඇත.

## 1.5. මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය

හාල්මැස්සන්, කරවල, උම්බලකඩ, ටින් මාලු හා ආහාරයට ගන්නා මසුන් මෙරටට ආනයනය කරනු ලබන ප්‍රධානතම මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වේ. මුළු ආනයනයෙන් වැඩි දායකත්වයක් ලබා දෙන්නේ කරවල හා හැල්මැස්සන්ය. ආනයනික මත්ස්‍ය ප්‍රමාණයෙන් කොටසක් අගය වැඩි කොට ප්‍රති අපනයනය කරන අතර ඉතිරිය දේශීය පරිභෝජනයට යොදා ගැනේ. දේශීය මත්ස්‍ය නිෂ්පාදනය හා පරිභෝජනය අතර පරතරය පිරවීමට මෙම ආනයනයන් ඉතා වැදගත්ය.2021 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන මෙට්‍රික් ටොන් 42,467.0 ආනයනය කර ඇති අතර එහි වටිනාකම රුපියල් මිලියන 18,808.5 කි.

## 1.6. මත්ස්‍ය අපනයනය



අපනයනය ක්ෂේත්‍රය තුළ මත්ස්‍ය ආහාර, විසිතුරු මසුන් හා මුහුදු පැළෑටි අපනයනය තුළින් ජාතික ආර්ථිකය සවිමත් කරලීම උදෙසා ධීවර අංශයෙන් ප්‍රමුඛ වූ දායකත්වයක් ලබා දෙනු ලැබේ. මෙම කාර්යය ඉටුකිරීමේදී ආනයනික රටවල නියෝග වලට අනුගත වෙමින් ගුණාත්මක හා සෞඛ්‍ය ආරක්ෂිත තත්ත්වයෙන් යුතු උසස් මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා එම කාර්යයේ නියුතු පාර්ශවකරුවන්ට නිසි මඟ පෙන්වීම හා ආධාර ලබා දීම තුළින් මත්ස්‍ය අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති කරලීමට පියවර ගෙන ඇත.

වගුව **1.6.1 :** අපනයන කරනු ලැබූ මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වල වටිනාකම

**මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වල අපනයන ප්‍රමාණය හා වටිනාකම**

| මත්ස්‍ය වර්ගය | අපනයන ප්‍රමාණය (මෙ.ටො.) | | අපනයන වටිනාකම (රු.මිලි.) | |
|---|---|---|---|---|
| | 2020 | 2021 ජන-සැප් | 2020 | 2021 ජන-සැප් |
| සජීවී මසුන් | අදාල නැත | අදාල නැත | 4.62; | 2754.1 |
| ඉස්සන් | 1.781 | 3,277.4 | 3,235 | 5,819.8 |
| පොකිරිස්සන් | 99 | 141.8 | 352 | 615.5 |
| කකුළුවන් | 1,361 | 1,233.6 | 3,068 | 4,226.8 |
| මුහුදු කුඩැල්ලන් | 326 | 184.8 | 1.581 | 1,123.0 |
| වෙනත් මෘද්වංශිකයින් | 1,477 | 1,402.2 | 1,409 | 1,448.9 |
| මෝරා | 55 | 58.9 | 341 | 456.1 |
| මාළු බොකු | 2 | 2.6 | 34 | 53.0 |
| බෙල්ලන් සහ කවච මසුන් | 221 | 213.4 | 141 | 129.5 |
| සකස් කළ මසුන් | 13,858 | 11,514.9 | 25,498 | 25,563.2 |
| වෙනත් | 2,119 | 937.5 | 1,805 | 916.1 |
| **මුළු එකතුව** | **41.298** | **18,967.0** | **39,874** | **43,106.1** |

මූලාශ්‍රය: සංඛ්‍යාලේඛන අංශය, ධීවර අමාත්‍යාංශය

## 1.7. විසිතුරු මසුන් අපනයනය



ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය නව විසිතුරු මත්ස්‍ය ප්‍රභේද හඳුන්වා දීම, අභිජනන කටයුතු, රෝග පැතිරීයාම වැළැක්වීම, ගුණාත්මක තත්ත්වයේ ආහාර ලබා දීම හා සම්බන්ධව වගා කරුවන් පුහුණු කිරීම හා දැනුවත් කිරීම, නාරා ආයතනයේ සහයෝගයෙන් මසුන්ගේ නව ප්‍රභේද බිහි කිරීම, තාක්ෂණික සංවර්ධනය, මත්ස්‍ය රෝග නිර්ණය, වගා කරුවන්ට ණය සහන ලබා ගැනීමට සහාය වීම ආදී ක්‍රමෝපායන් මගින් විසිතුරු මසුන් අපනයනය දිරිමත් කිරීමට කටයුතු යොදා ඇත.

පොලොන්නරු දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ වගාකරුවන් රාශියක් විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙනු ලබයි. එසේම පොලොන්නරුව දිස්ත්‍රික්කයේ සෙවනපිටිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් ඉදිකර ඇති අතර, පුත්තලම දිස්ත්‍රික්කයේ බංගදෙනියේ කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් ඉදිකිරීමට අවශ්‍ය ප්‍රතිපාදන කටයුතු ආරම්භ කර ඇත.

2021 වසරේ ජනවාරි - සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදයේදී විසිතුරු මසුන් අපනයනයෙන් රු.මිලියන 2,754.1 ක් උපයා ගැනීමට හැකියාව ලැබී ඇත.

## 1.8. විසිතුරු ජලජ පැළෑටි අපනයනය

රඹඩගල්ල විසිතුරු මසුන් අභිජනන මධ්‍යස්ථානයේ පටක රෝපණ අංශය මගින් නිෂ්පාදිත විසිතුරු ජලජ පැළෑටි මිල දී ගැනීම සහ අපනයනය සඳහා ඇක්වා ඇග්‍රි පුද්ගලික සමාගම සමඟ ගිවිසුම් ගතව ඇති අතර 2021 අගෝස්තු වන විට නිෂ්පාදිත ජලජ පැළෑටි සංඛ්‍යාව 26,910 කි.



වගුව **1.8.1 :** අනෙකුත් මත්ස්‍ය හා ජලජ පැළෑටි අපනයනය

| | අපනයන ප්‍රමාණය මෙ.ටො. | අපනයන වටිනාකම රු.මි. |
|---|---|---|
| මුහුදු පැළෑටි | 54.00 | 5.40 |
| කිවුල්දිය ඉස්සන් | 1,069.80 | 1,874.60 |
| මිරිදිය ඉස්සන් | 57.38 | 156.94 |

# ධීවර සමාජ සංවර්ධනය

## 1. ධීවර ප්‍රජාව බලගැන්වීමේ වැඩසටහන

ධීවර ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම, ධීවර ප්‍රජා සංවර්ධන හා සුභ සාධනය වැඩි දියුණු කිරීම මූලික කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ඇත. 2021 වර්ෂය සඳහා මෙම වැඩසටහන වෙනුවෙන් රු.මි.40 ක මුදලක් වෙන් වී ඇත. එම ප්‍රතිපාදන යොදා ගනිමින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය යන ආයතන විසින් ධීවර ප්‍රජාව බලගැන්වීම හා අදාල  වැඩසටහන් 05 ක් ක්‍රියාත්මක කරනු ලැබේ

### 1.1. අලුතින් ධීවර කර්මාන්තය ආරම්භ කළ  ධීවර සංවිධානවල සාමාජිකයින් සඳහා නවීන බෝට්ටු හා දැල් කට්ටල ලබාදීම.

වගා පාදක ධීවර කර්මාන්තය සඳහා අළුතින් යොදා ගන්නා ලද ජලාශ වල ධීවර කාර්මිකයින් ධීවර කර්මාන්තය වෙත ප්‍රවේශ කිරීමට හා උනන්දු කිරීම තුළින්  ඔවුන්ගේ ධීවර කටයුතු ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කර ගනිමින් මෙම ව්‍යාපෘතිය  ක්‍රියාත්මක වේ. 2021 වර්ෂය තුළ රු.මි. 8 වෙන් කරමින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ සියළුම දිස්ත්‍රික්ක වල නව වගා පාදක ධීවර කර්මාන්තය ආරම්භ කරන ජලාශ ආශ්‍රිතව ධීවර ප්‍රතිලාභීන් ඉලක්ක කර ගනිමින් ආරම්භ වී ඇත.

මොණරාගල, හම්බන්තොට, මාතර , පුත්තලම,රත්නපුර, අනුරාධපුරය, පොළොන්නරුව, කිළිනොච්චිය හා බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි ධීවරයින් සමඟ සාකච්ඡා කර ලබා ගත් තොරතුරු පදනම් කර ගනිමින් ධීවරයින්ගේ අවශ්‍යතාවය පරිදි නව යාත්‍රා හඳුන්වා දීම හෝ අවශ්‍ය නව අංගෝපාංග යාත්‍රාවට හඳුන්වාදීම ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි අපේක්ෂාව වේ. ඒ අනුව,  සී/ස සිනෝර් ආයතනය සමඟ එක්ව ආකෘති 04 ක යාත්‍රා නිෂ්පාදනය කර ඇති අතර, ඉන් ආකෘති 03 කට අදාල යාත්‍රා මිලදී ගැනීමේ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.

### 1.2. කුඩා පරිමාණ ධීවර යාත්‍රා (OFRP ) සඳහා ප්‍රජා සහභාගීත්ව පදනමින් බහාලුම් ලබාදීම.

මත්ස්‍ය  පසු අස්වනු හානිය අවම කිරීම සඳහා පහසුකම් සැලසීම අපේක්ෂා කර ගනිමින් 2021 වර්ෂය තුළ ආරම්භ කර ඇති මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 8 වෙන් කර ඇත. ධීවර දිස්ත්‍රික්ක 15 ම ආවරණය වන පරිදි එම දිස්ත්‍රික්කවල පවතින OFRP යාත්‍රා සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ඒ අනුව සාධාරණ ලෙස බෙදී යන  ආකාරය හා 2020 වර්ෂයේ ඇසුරුම් පෙට්ටි බෙදා දුන් ආකාරයද  සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාවේ සියලුම ධීවර දිස්ත්‍රික්ක වලට සාධාරණය සිදුවන පරිදි  OFRP ධීවර යාත්‍රා සඳහා ඇසුරුම් පෙට්ටි 200ක් හෝ ඒ අවස්ථාවේ පවතින මිල ගණන් යටතේ 25% දායකත්වයද  ඇතුලත්ව ලබා ගත හැකි උපරිම මත්ස්‍ය ඇසුරුම් පෙට්ටි සංඛ්‍යාව මිලදී ගැනීමේ කාර්යයන් මේ වන විට ආරම්භ කර ඇත.

## 1.3. සාගර විශ්ව විද්‍යාලය භාවිතා කර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

පාසැල් අධ්‍යාපනය අවසන් කරනු ලබන හෝ පාසැල් අධ්‍යාපනය තුළින් ඉවත් වන ධීවර පවුල් ආශ්‍රිත රැකියා විරහිත තරුණ ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය තුළ රු.මි. 12 ප්‍රතිපාදන මුදලක් වෙන් කර ඇත. ද්විතීක අධ්‍යාපනය, අ.පො.ස (සා.පෙළ) දක්වා අධ්‍යාපනය අවසන් කර ඇති, ධීවර ක්ෂේත්‍රයේ අඩු ආදායම්ලාභී දරු දැරියන් සඳහා විධිමත් තාක්ෂණය හා පුහුණුව ලබා දීම තුළින් ධීවර ක්ෂේත්‍රයේ නව ව්‍යවසායකයකු බිහිකරලීම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙහි අරමුණු වේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත පිළිවෙලින් රු.මි. 8 හා 4 බැගින් වෙන් කර ඇති අතර, මේ වන විට ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් පාඨමාලාවන් 04 ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, ඒ සඳහා තරුණ අපේක්ෂිතයින් 75 දෙනෙකු යාපනය සහ මාතර දිස්ත්‍රික්ක තුළින් තෝරා පත් කරගෙන ඇත.

## 1.4. කාන්තා ධීවර සමිති 250 බල ගැන්වීම

ධීවර කාන්තාවන්ගේ සමාජ, ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම තුළින් ජීවන තත්වයන් ඉහළ නැංවීම අපේක්ෂා කර ගනිමින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය තුළ රු.මි. 5 ක් වෙන් කර ඇත. යාපනය, මන්නාරම, පුත්තලම හා හලාවත ප්‍රදේශයන්හි කරවල නිෂ්පාදනයේ යෙදෙන කාන්තාවන් 70 ක් සඳහා උපකරණ කට්ටලයක් ලබා දීමට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති අතර, ඊට අදාල කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. මෙම කාර්යයට අදාලව රු.මි 4 වැය කිරීමට නියමිත අතර, එක් කට්ටලයක දළ ඇස්තමේන්තුව 55,000 කි.

මිරිදිය කරවල නිෂ්පාදනයෙහි නිරත ධීවර කාන්තාවන් ඉලක්ක කර ගනිමින් කිළිනොච්චි දිස්ත්‍රික්කයෙහි ඉරණමඩු ප්‍රදේශයෙහි හා පොළොන්නරුව දිස්ත්‍රික්කයෙහි සොරවිල හා මාදුරුඔය ප්‍රදේශයෙහි ප්‍රතිලාභීන් 60 දෙනෙකු තෝරා ගනිමින් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් රු.මි. 1 මුදලක් වැය කරමින් දුම්/වියළි කරවල නිෂ්පාදන වල ගුණාත්මකභාවය වැඩි කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිලාභීන් හඳුනාගැනීමේ හා කරවල නිෂ්පාදන ඒකක වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයන් හඳුනාගැනීමේ කටයුතු සිදු කර අවසන් වී ඇති අතර, ඔවුනට අදාල පුහුණු පාඨමාලා කටයුතු ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

## 1.5. අක්‍රියව පවතින ධීවර සමුපකාර සමිති 300 ක් ප්‍රතිසංවිධානය කිරීම.

ධීවර ප්‍රජාව සඳහා තම කර්මාන්තය පවත්වා ගෙන යාම සඳහා විශාල දායකත්වයක් ධීවර සමුපකාර සමිති තුළින් සිදු කරනු ලබයි. එහෙත් විවිධ හේතු මත අක්‍රියව පවතින තෝරාගත් ධීවර සමුපකාර සමිති යළි ප්‍රතිසංවිධානය කිරීමට අවශ්‍ය ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, එමෙන්ම සමුපකාර දෙපාර්තමේන්තුව සමග එක්ව ධීවර සමුපකාර සමිති සඳහා අවශ්‍ය පොත් පත් ලේඛන ලබා දීමද, අවශ්‍ය මූල්‍යමය ණය පහසුකම් ධීවරයින් වෙත ලබා දීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබයි. 2021 වර්ෂය තුළ රු.මි. 7 ක් වෙන් කර ඇති බැවින්, දැනට ක්‍රියාත්ම ධීවර සමුපකාර සමිති තෝරා එම සමුපකාර සමිති සඳහා දිස්ත්‍රික් මට්ටමින් යෝජනා කැඳවීම සිදු කර ඇත.

## 2. නව තාක්ෂණය සඳහා සහාය වැඩසටහන

මෙරට සංවර්ධනය සඳහා ඉහළ දායකත්වයක් ලබා දීම සඳහා ධීවර කර්මාන්තය තිරසාර ලෙස සංවර්ධනය කළ යුතු අතර ඒ සඳහා නව තාක්ෂණ දැනුම ධීවර කාර්මිකයින් වෙත ලබා දීම අත්‍යාවශ්‍ය වේ. 2021 වර්ෂය සඳහා මෙම වැඩසටහන වෙනුවෙන් රු.මි. 60 ක මුදලක් වෙන් වී ඇත. ඊට අදාලව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය යන ආයතන තම දායකත්වය ලබා දෙමින් මෙම වැඩසටහන යටතේ සංවර්ධන ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කරනු ඇත.

### 2.1. මත්ස්‍ය බිම් සොයා ගැනීම සඳහා මෘදුකාංගයක් සැකසීම.

ශ්‍රී ලංකා මුහුදු ප්‍රදේශය තුළ දැනට පවතින ධීවර බිම් පුරෝකථන ක්‍රමවේදය වැඩි දියුණු කිරීම සඳහා ධීවරයින් විසින් ගොඩ ගනු ලබන මත්ස්‍ය අස්වැන්න පිළිබඳව දත්ත එකතු කරමින් මත්ස්‍ය ගහන බහුල ප්‍රදේශයන් පිළිබඳව තොරතුරු බෙදා හැරීම සඳහා පවතින මෘදුකාංගය වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ලැබේ. 2021 වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 10 මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇත. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය විසින් පුරෝකථනයන්හි නිරවද්‍යතාව වැඩි කිරීම සඳහා භාවිතා කළ හැකි උෂ්ණත්ව සංවේදක (Temperature depth sensors) හා මෘදුකාංගය මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි තොරතුරු තාක්ෂණ අංශය විසින් මීට අදාල මෘදුකාංගය සංවර්ධනය කිරීමේ කටයුතු සිදු කරනු ඇත.

### 2.2. වෙරළාසන්න ධීවර මත්ස්‍ය බිම් 10 ක් සඳහා FAD සවිකිරීම.

කෘත්‍රිම මත්ස්‍ය එකතුවීමේ උපකරණ (Fish Aggregating Device) භාවිත කිරීම තුළින් මත්ස්‍ය පැටවුන් බෝ කිරීමේ ස්ථාන වැඩිවීම තුළින් මත්ස්‍ය ගහනය ඉහළ යන බැවින් එම ප්‍රදේශයේ සිටින කුඩා පරිමාණ ධීවරයින්හට ඉහළ ආදායමක් උපයාගත හැකි වේ. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මාතර-වැලිගම සහ ත්‍රිකුණාමලය වෙරළබඩ ප්‍රදේශ ආශ්‍රිතව තෝරාගත් ස්ථානයක නියමු ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය තුළ රු.මි 10 වෙන් කර ඇත.

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මේ වන විට ව්‍යාපෘති ක්‍රියාත්මක ප්‍රදේශයන් තෝරා ගෙන ඇති අතර, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය විසින් අදාල ව්‍යුහ සැකැස්ම ආකෘතිය නිර්මාණය කිරීමේ කටයුතු සිදු කර ඇත.

## 2.3. පරිසර හිතකාමී අඩු ඉන්ධන / විකල්ප ඉන්ධන/ බල ශක්ති සහිතව වැඩි දියුණු කළ යාත්‍රාවක් හඳුන්වාදීම හා ප්‍රවර්ධනය

විකල්ප බලශක්ති ප්‍රභවයන් උපයෝගී කරගනිමින් ධීවර හා සංචාරක කටයුතු සඳහා කළපු සහ ජලාශ සඳහා නව බෝට්ටුවක් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වේ. එහිදී පුනර්ජනනීය බලශක්තිය ප්‍රයෝජනයට ගැනීම මඟින් පරිසර දූෂණය අවම කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ. මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය තුළ රු.මි. 10 ක මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇත.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය විසින් ජලාශ හා කලපු ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන මෙම වැඩසටහන සඳහා වික්ටෝරියා, රන්දෙණිගල, ඉහළ කොත්මලේ, රිදියගම, මුරුතවෙල යන ජලාශ හා බටිටිකොලෝවා, ඊකව සහ පුත්තලම යන කලපු තෝරා පත් කර ගෙන ඇත. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මීට අදාලව පසු අස්වනු නාස්තිය අවම කිරීම සඳහා නිර්මාණය කිරීමට අවශ්‍ය බහුදින යාත්‍රාව නිර්මාණය කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් තිබේ.

## 2.4. වෙරළාශ්‍රිත මුහුදු තීරයේ මත්ස්‍ය ගහනය වැඩි කිරීම සඳහා අබලි වාහන භාවිතයෙන් ඇටවුම් යෙදවීම.

වෙරළාසන්න මුහුදු පතුලෙහි කෘත්‍රිම උපස්ථර මත මත්ස්‍ය අභිජනන ස්ථාන ඇතිකිරීම අරමුණු කර ගනිමින් භාවිතයෙන් ඉවත්කළ බස්රථ සැකිලි ව්‍යුහයන් පරිසරයට හානියක් නොවන සේ සාගරයේ තැන්පත් කර කෘත්‍රිම උපස්ථර ලෙස යොදා ගනු ලබන මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය තුළ රු.මි. 10 මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇත. මෙය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය එක්ව සිදු කරනු ලබන නියමු ව්‍යාපෘතියකි.

අතහැර දැමූ යාත්‍රා හා බස් රථ සැකිලි යොදාගෙන කෘත්‍රිම සමුද්‍ර පරිසර පද්ධති නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියෙහි තුන්වන අදියරය ලෙස ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් යාපනය මුහුදේ බස් රථ 38 ක් ගිල්වා ඇති අතර, විනාශ වූ මුහුදු වාසස්ථාන ප්‍රතිෂ්ඨාපනය කිරීම මඟින් වෙරළබඩ මත්ස්‍ය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සම්බන්ධ පාරිසරික ක්‍රියාවලියන් පරීක්ෂා කිරීම සඳහා පර්යේෂණ කිරීමට අදාල උපකරණ (Action camera) මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය විසින් ආරම්භ කර ඇත.



යාපනය සහ ත්‍රිකුණාමලය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

## 2.5. හීනවූ මත්ස්‍ය ගහනය ඉහළ නැංවීමට මසුන් තැම්පත් කිරීම - මසුන් වර්ග හා ප්‍රමාණයන් හඳුනාගැනීමේ පර්යේෂණ කටයුතු.

මත්ස්‍යයන් නැවත තැන්පත් කිරීමේ වැඩසටහන මඟින්, හීන වූ මත්ස්‍ය විශේෂවල නිෂ්පාදනය ඉහළ නැංවීම, ආදායම උත්පාදනය ඉහළ නැංවීම මඟින් ධීවර ජනතාවගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම, ජලජීවී වගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 10 ප්‍රතිපාදන මුදලක් වෙන් කර ඇත.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය විසින් මාතර පොල්හේන ගල්පරය සහ ඒ ආශ්‍රිත පරිසර පද්ධතිය දකුණු වෙරළ තීරය තුළ මත්ස්‍ය විශේෂ සහ කොරල් විශේෂ වැඩි කිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාජ දැනුවත් කිරීමට කටයුතු සිදු කර ඇති අතර අදාල කෘත්‍රිම ව්‍යුහයන් සැකසුම සැකසීමේ කටයුතු හා ප්‍රමාණ පත්‍ර සැකසීමේ කටයුතු සිදු කර ඇත. තෝරා ගන්නා ලද රැකව, පානම, කොමරි, පෙරිය, ලුනු කලපු තුළ මත්ස්‍ය පැටවුන් තැන්පත් කර හීන වූ මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම පිළිබඳව පර්යේෂණ කටයුත්තට අදාල ව්‍යාපෘතිය සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවෙහි නිර්දේශ ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

එක් එක් ජලාශවල තැන්පත් කරන මසුන්,නෙලාගැනීමේ දී මත්ස්‍ය නිෂ්පාදනය සඳහා විශේෂ දායකත්වයක් දැක්වූ මත්ස්‍ය විශේෂ එකී ජලාශවල හීන වෙමින් පවතින්නේද යන්න හඳුනාගැනීම අවශ්‍ය පර්යේෂණාත්මක දත්තයන් ලබාගැනීමට ජාතික ජලජීවී වගා අධිකාරිය විසින් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරීන් මඟින් මෘදුකාංගයක් ඔස්සේ සියළු තොරතුරු ජාලගත කර මාර්ගගත යාවත්කාලීන(online update) කිරීම සඳහා ජලජීවී වගා ව්‍යාප්ත නිලධාරීන්

වෙත TAB ලබා දීමේ එක් අදියරක් මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ඇත. ඒ සඳහා අවශ්‍ය පිරිවිතරයන් හා ලංසු කැඳවීමේ කටයුතු සිදු කරමින් පවතී.

## 2.6. දැනට නෙළා නොගන්නා මසුන් වර්ග නෙළා ගැනීම සඳහා පර්යේෂණ හා නවීන උපකරණ භාවිතය.

මිරිදිය ධීවර කර්මාන්තය ආශ්‍රිතව දීර්ඝ කාලීනව මත්ස්‍ය අස්වැන්න නෙලාගැනීම හේතුවෙන් ගහන ගණත්වය අඩුවී ඇති මත්ස්‍ය විශේෂ හඳුනාගැනීම හා  එම විශේෂ වල ගහන ගණත්වය යථාතත්වයට පත්කිරීම ධීවර කර්මාන්තයට අත්‍යාවශ්‍ය වේ .මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය තුළ රු.මි. 10 මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇත. මෙම කාර්යය සඳහා ද මත්ස්‍ය අස්වැන්න නෙලාගන්නා ප්‍රමාණ හා එහි විවිධත්වයන් එම එක් එක් විශේෂයන්හි අස්වැන්න නෙලාගැනීම හා ලැබීම සිදුවන කාල වකවානු පිලිබඳව අවශ්‍ය දත්ත ලබාගැනීම සඳහා ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරීන් මඟින් මෘදුකාංගයක් ඔස්සේ සියළු තොරතුරු ජාලගත කර මාර්ගගත යාවත්කාලීන(online update) කිරීම සඳහා ජලජීවී වගා ව්‍යාප්ත නිලධාරීන් වෙත TAB ලබා දීමේ තවත් අදියරක් මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ඇත. ඒ සඳහා අවශ්‍ය පිරිවිතරයන් හා ලංසු කැඳවීමේ කටයුතු සිදු කරමින් පවතී.

බහුදින ධීවර යාත්‍රා මඟින් දැනට අඩු වශයෙන් නෙලා ගනු ලබන, ඉහළ ආර්ථික වටිනාකමකින් යුතු big eye tuna මත්ස්‍ය විශේෂය නෙලා ගැනීම සම්බන්ධයෙන් පර්යේෂණාත්මක වැඩසටහන දික්ඕවිට සුදුවැල්ල ධීවර වරායන් හි බහු දින ධීවර යාත්‍රා පාදක කරගනිමින් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව එක්ව ක්‍රියාත්මක කරනු ලැබේ. මෙහි දී දැනට භාවිත කරනු ලබන මරුවැල් හි දිග වැඩි කිරීම තුළින් ටූනා මසුන් නෙලා ගැනීම පිළිබඳව පර්යේෂණ කාර්යයට අදාල කටයුතු සිදු කරමින් පවතින අතර, පර්යේෂණය සඳහා සුදුසු යාත්‍රාවක් තෝරා ගැනීමේ කාර්යය නිම කර ඇත.

# 3. කලපු සංරක්ෂණ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

සාගර මත්ස්‍ය සම්පත් ශීඝ්‍රයෙන් ක්ෂය වෙමින් පවතින තත්වයක් තුළ අනාගත මත්ස්‍ය නිෂ්පාදනයේ විශාල කොටසක් ජලජීවී වගාව හා වගාපාදක ධීවර කර්මාන්තය මත පදනම්වේ.  ඒ  සඳහා, කලපු පරිසර පද්ධතිය ධීවර කර්මාන්තය සඳහා මහත් පිටුවහලක් සපයනු ලබයි. කලපු හා අභ්‍යන්තර ජලාශ ආශ්‍රිත ජලජ පරිසර සංරක්ෂණය හා සංවර්ධනය තුළින් ජලජීවී නිෂ්පාදන ඉහළ නැංවීම ප්‍රධාන උපාය මාර්ගය කර ගනිමින් මත්ස්‍ය හා ජලජීවී නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණෙන් යුතුව කලපු සංවර්ධනය හා සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය 2018 වර්ෂයේ සිට ධීවර අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලදී.

කලපු පිරිසිදු කිරීම, ජලජීවී වගාව ඉහළ නැංවීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, කලපු මායිම් ලකුණු කිරීම හා ජීවනෝපාය සංවර්ධනය, කලපුවේ ජල හුවමාරුව නිසිපරිදි සකස්වන පරිදි ඇල මාර්ග ගැඹුරු කිරීම, කඩොලාන සංරක්ෂණය කිරීම,තහනම් ආම්පන්න ඉවත් කිරීම සහ මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම තුළින් මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණු අතර වෙයි. එමෙන්ම නව රැකියා අවස්ථා බිහිකිරීම, සංචාරක කර්මාන්තය ව්‍යාප්ත කිරීම යන ඉලක්කයන් ද මෙම ව්‍යාපෘතිය තුළින් ළඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ.

කලපු සංරක්ෂණ හා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මෙම වසර තුළ වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.400 වන අතර ධීවර අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය එක්ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව, මෙම වැය විෂය යටතේ පහත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරනු ලැබේ.



නව රජය බලයට පත් වීමෙන් පසු ශ්‍රී ලංකාවේ ප්‍රධාන කලපු 09ක් සංවර්ධනය කිරීම සඳහා ධීවර අමාත්‍යවරයා **NAQDA, NARA** සහ ධීවර දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දී අවශ්‍ය ව්‍යාපෘති සකස් කිරීමේ කටයුතු ආරම්භ කර තිබූ අතර දැන් ඒවායේ වර්තමාන තත්වය පිළිබඳව විමර්ශනය කිරීමේ රැස්වීමක් **2021.06.14**වන දින ධීවර අමාත්‍යාංශයේදී පැවැත්විණි.



මීගමු කලපු සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී මතුවී ඇති ගැටලු පිළිබඳ ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්දාගේ හා වන සංරක්ෂණ රාජ්‍ය අමාත්‍ය විමලවීර දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් **2021.10.14** දින පැවති සාකච්ඡාව



මීගමුව කලපු සංවර්ධන ව්‍යාපෘතියේ වර්තමාන තත්වය පරීක්ෂා කිරීමේ ක්ෂේත්‍ර චාරිකාවක

## 3.1 කලපු මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 2.2 ක ප්‍රතිපාදන වැයකර යාපනය දිස්ත්‍රික්කයේ තොන්ඩමන් ආරු කලපුවේ කරඅඩු ඉස්සන් පැටවුන් මිලියන 4 ක් හා රු.මිලියන 0.825 ක ප්‍රතිපාදන වැය කර මඩකලපුව කලපුවේ කරඅඩු ඉස්සන් පැටවුන් මිලියන 1.5 ක් තැන්පත් කර ඇත.

කලපු මත්ස්‍ය ගහනය ඉහළ නැංවීමේ ව්‍යාපෘති සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත රු.මි.15.1 වෙන් කර ඇති අතර එයට අදාලව යාපනය කලපුව ආශ්‍රිතව මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම හා මත්ස්‍ය ගහනය ඉහළ නැංවීමේ ව්‍යාපෘති සිදු කරනු ලබයි.



**උතුරු පළාතේ මෝදා මාළු (කොඩුවා)වගාව ආරම්භ කිරීම සම්බන්ධ සාකච්ඡාව**

## 3.2 මෝදා මත්ස්‍ය වගාව

පුත්තලම කලපුවේ මෝදා මත්ස්‍ය කූඩුවල මෝදා මත්ස්‍ය පැටවුන් 14,000 ක් තැන්පත් කර ඇත. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායනය විසින් යාපනය කලපුව තුළ මෝදා මත්ස්‍ය වගා අධ්‍යනයක් සිදු කරනු ලැබේ.





මෝදා මත්ස්‍ය වගා කූඩු

## 3.3 කලපු සීමා නිර්ණය කිරිම

කලපු සීමා නිර්ණය කිරිම සඳහා රුපියල් මිලියන 11 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර අරුගම්බේ, ලංකාපට්ටුන, හලාවත, මුන්දලම, රැකව, කෝකිලායි යන කලපු වල සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් මායිම් කණු 4,660 ක් සිටුවා ඇත.

## 3.4 කලපු පිරිසිදු කිරිම හා ගැඹුරු කිරිම

මුලතිව් දිස්ත්‍රික්කයේ නන්දිකඩාල් කලපුවේ ධීවර කර්මාන්තය ආශ්‍රිත සංවර්ධන කටයුතු සම්බන්ධව ජාතික ජලජ සම්පත් පර්යේෂණ නියෝජිතායතනය විසින් මූලික පාරිසරික ඇගයීම් වාර්තාවක් සකස් කර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. මෙහි පළමු තාක්ෂණික කමිටු රැස්වීම පවත්වා ඇත එම පාරිසරික අධ්‍යානය නැවත සිදු කරන ලෙසට උපදෙස් ලබාදී ඇත.

- නයාරු කලපුවේ ධීවර කර්මාන්තය ආශ්‍රිත සංවර්ධන කටයුතු සම්බන්ධ වාර්තාව ජාතික ජලජ සම්පත් පර්යේෂණ නියෝජිතායතනය විසින් සකස් කරමින් පවතී.
- රැකව කලපුවේ කපුහේන්දිවල පාලම යට අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර දෙන ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.
- ආරුගම්බෙ කලපුවෙහි bathymetric survey සිදු කිරීම ජාතික ජලජ සම්පත් පර්යේෂණ නියෝජිතායතනය විසින් සිදු කරමින් පවතී.

## 3.5 යටිතල පහසුකම් සංවර්ධනය

යාපනය දිස්ත්‍රික්කයේ කලපු ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 17 ක් සඳහා රු. මිලියන 26 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් යාපනය වෙත යොමු කර ඇත . ඒ අනුව, යාපනය දිස්ත්‍රික්කයෙහි චාවකච්චේරි, වලිකාමම්, යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මූලික කර ගනිමින් වීදි ලාම්පු සවිකිරීම්, බිකන් පහන් සවිකිරීම්, වෙරළාශ්‍රිත ප්‍රදේශයන්හි විදුලි ලාම්පු සවිකිරීම හා මසුන් වෙන්දේසි කිරීමේ මධ්‍යස්ථාන නවීකරණය සිදු කරනු ලැබේ.

## 3.6 ජීවනෝපාය සංවර්ධනය

කලපු ආශ්‍රිත ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත පිළිවෙළින් රු.මි.3 හා රු.මි.101.4 වෙන් කර ඇත. ඒ අනුව, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් යාපනය කලපුව මූලික කර ගනිමින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අතර එහි දී කකුළුවන් වගාව, කුඩු තුළ මොදා මත්ස්‍ය වගාව, ඉස්සන් වගාව, මුහුදු කූඩැල්ලන් වගාව, මුහුදු පැළැටි වගාව යන ජලජීවී වගාවන් සිදු කරනු ලැබේ.

## 01. හරිත වරාය සංකල්පය යටතේ බේරුවල ,ගාල්ල, පුරාණ වැල්ල සහ කුඩාවැල්ල ධීවර වරායයන් සංවර්ධනය කිරීම

ජාත්‍යන්තර ප්‍රමිතින්ට අනුකූලව හරිත වරාය සංකල්පය යටතේ බේරුවල, ගාල්ල, පුරාණ වැල්ල සහ කුඩාවැල්ල යන ධීවර වරායයන් සංවර්ධනය කිරීම සඳහා වන මෙම ව්‍යාපෘතිය ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනයේ ප්‍රංශ රාජ්‍ය ණය ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතය. මේවනවිට ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සහ තාක්ෂණික ශක්‍යතා අධ්‍යයනය නිම කර ඇති අතර පාරිසරික හා සමාජයීය ශක්‍යතා අධ්‍යයනය සිදු කරමින් පවතී. ධීවර ප්‍රජාවගේ ජීවනෝපායයන් වැඩි දියුණු කිරීම, ඉහළ ගුණාත්මයේ මත්ස්‍ය නිෂ්පාදන සඳහා වෙළඳපොළ ප්‍රවේශය ඇති කිරීම සහ ධීවර සුභසාධනය නංවාලීම මෙම ව්‍යාපෘතියේ මූලික අපේක්ෂාව වේ.

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය යූරෝ.මි.137.5 ක් වන අතර ව්‍යාපෘති කාලය වසර 5 (2021-2026) කි. ව්‍යාපෘතියේ ඉදිකිරීම 2023 වසරේ දී ආරම්භ කිරීමට නියමිතය.

## 02. ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ධීවර හා වෙරළ කලාප කළමනාකරණය සඳහා ප්‍රමුඛතාවය ලබාදීම සඳහා උපදේශ සේවා සහ විශ්ලේෂණ (තාක්ෂණික සහාය) ලබාගැනීම

සමුද්‍රීය හා ජලජීවී වගා යන අංශවල නිරසාර නොවන අයුරින් මත්ස්‍ය අස්වනු නෙලීම (Over exploitation) සහ ධීවර සම්පත් කළමනාකරණ ගැටළු විසඳීම සඳහා උපාය මාර්ග සකස් කිරීම වෙනුවෙන් පහත දැක්වෙන අධ්‍යයනයන් සිදු කිරීම මෙහි අරමුණ වේ.

i. ජලජීවී වගාවේ ආයෝජන
ii. බහුදින ධීවර කටයුතු පිළිබඳ මූල්‍ය හා ජීව විද්‍යාත්මක විශ්ලේෂණය
iii. කුඩා ප්‍රමාණයේ සමුද්‍රීය මත්ස්‍ය තොග තක්සේරු කිරීම සඳහා නාරා ආයතනය සහ ධීවර දෙපාර්තමේන්තුව වෙත තාක්ෂණික සහාය ලබාදීම
iv. පොකිරිස්සන් තොග තක්සේරු කිරීම සඳහා නාරා ආයතනය සහ ධීවර දෙපාර්තමේන්තුව වෙත තාක්ෂණික සහාය ලබාදීම
v. ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ධීවර කළමනාකරණය සඳහා ජෛව ආර්ථික ආකෘති (Bioeconomic modeling) නිර්මාණය කිරීම

මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මි.130 වන මෙම ව්‍යාපෘතිය ලෝක බැංකු ප්‍රදානයක් යටතේ ක්‍රියාත්මක කරමින් පවතී. උක්ත අධ්‍යයනයන්ට අදාළව අතුරු වාර්තාව මේ වනවිට කෙටුම්පත් කර ඇත.

## එම්වී එක්ස්ප්‍රස් පර්ල් නෞකාව සම්බන්ධ සමුද්‍රීය හානි හේතුවෙන් මතුවූ ගැටලු විසඳීම සඳහා අනුගමනය කළ පියවර

ඉන්දියාවේ හසීරා වරායේ සිට සිංගප්පූරුවේ ධජය සහිත එම්වී එක්ස්ප්‍රෙස් පර්ල් යාත්‍රාවෙන් නයිට්‍රික් ඇසිඩ් මෙට්‍රික් ටොන් 25 ක් සහ තවත් රසායනික ද්‍රව්‍ය සහ ආලේපන කිහිපයක් සමඟ බහාලුම් 1,486 ක් සහ බංකර් තෙල් මෙට්‍රික් ටොන් 278 ක් සහ මුහුදු ගෑස් තෙල් මෙට්‍රික් ටොන් 50 ක් ගෙන යමින් සිටි අතරතුරදී ගිනිගැනීමකට ලක්විය. මෙම ගින්න මුලින්ම හඳුනා ගනු ලැබුයේ 2021 මැයි 20 වන දින වන අතර නෞකාව ඒ වන විට ශ්‍රී ලංකාවේ වෙරළට කි.මී 9.5 ක දුරකින් නැංගුරම් ලා තිබුණි. ප්ලාස්ටික් කැබලි, තෙල් හා රසායනික ද්‍රව්‍ය හේතුවෙන් බටහිර වෙරළ තීරයේ ධීවර කර්මාන්තයට සැලකිය යුතු ආර්ථික හානියක් සිදු විය. ධීවරයින්ගේ ආරක්ෂාව, ධීවර ආම්පන්න ,බෝට්ටු සහ පාරිභෝගිකයින්ගේ ආරක්‍ෂාව තහවුරු කිරීම සඳහා කළුතර සිට මීගමුව දක්වා බලපෑමට ලක්වූ ප්‍රදේශවල ධීවර තහනමක් පැනවීමට රජය වහාම පියවර ගත්තේය.

කළුතර සිට මීගමුව දක්වා වෙරළ තීරය තෙල්, රසායනික ද්‍රව්‍ය සහ පිළිස්සුණු අංශු ,ප්ලාස්ටික් කැබලි වලින් අපවිත්‍ර වීම නිරීක්ෂණය වී ඇත. ප්ලාස්ටික් කැබලි, තෙල් හා රසායනික අපද්‍රව්‍ය වෙරළබඩ ධීවර හා සාගර පරිසර පද්ධති කෙරෙහි ඉහළ අහිතකර බලපෑමක් එල්ල කර ඇත. කොරල්පර, මුහුදු පැලෑටි, මත්ස්‍ය වාසස්ථාන ඇතුළු සමස්ත පරිසර පද්ධතියටම බරපතල බලපෑම් ඇති වන බව විශේෂඥයින් කියා සිටින ලදී. එම නිසා එම්වී එක්ස්ප්‍රස් පර්ල් යාත්‍රාවේ බලපෑම වඩාත් පුළුල් වන අතර ශ්‍රී ලංකාවේ පාරිසරික, සමාජීය, ආර්ථික හා සෞඛ්‍ය අංශ කෙරෙහි කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන බලපෑම් ඇති විය හැකිය. ධීවර අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ ඒ යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ආයතන එමගින් සිදුවන අහිතකර බලපෑම් අවම කර ගැනීමට සහ ධීවරයින් සහ මුහුදු ආහාර පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා විවිධ පියවර ගෙන ඇත. ධීවර ක්ෂේත්‍රයට ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා මීගමුව, කළුතර සහ කොළඹ ධීවර දිස්ත්‍රික්ක වල ධීවර කටයුතු තහනම් කෙරිනි. මෙම තාවකාලික ධීවර තහනම 2021.05.21 දින පනවන ලද අතර නාරා ආයතනයේ විද්‍යාත්මක නිර්දේශ මත එය අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි.

සිදුවූ හානිය අවම කර ගැනීමට සහ සිදුවූ හානි සඳහා වන්දි ලබා ගැනීමට ධීවර අමාත්‍යාංශය විවිධ පියවර ගැනීමට සම්බන්ධ විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කමිටු දෙකක් පත් කරන ලදී.

i. වන්දි ගෙවීම පිළිබඳව තීරණය කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් කැබිනට් මණ්ඩලය විසින් පත්කළ කමිටුව

ii. මේ හා බැඳුනු සියලු ගැටලු පිළිබඳව සොයා බැලීම සඳහා අදාළ නිලධාරීන්, විශේෂඥයින්, ප්‍රජා සාමාජිකයින් සහ කතෝලික පල්ලියේ නියෝජිතයින්ගේ සමන්විත කමිටුව

## <u>අමාත්‍යාංශය විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදී.</u>

1. නාරා ආයතනය විසින් හඳුනාගෙන ඇති මීගමුවේ සිට පානදුර දක්වා ප්‍රදේශයේ පනවා තිබූ ධීවර තහනම කවදුරටත් ක්‍රියාත්මක කෙරිණි. ධීවරයින්ගේ ජීවිත, ඔවුන්ගේ බෝට්ටු සහ ධීවර ආම්පන්න වලට හානි පමුණුවන මුහුදු පත්ලේ ඇති විශාල සුන්බුන් 200 කට අධික සංඛ්‍යාවක් හඳුනා ගැනීම හේතුවෙන් මත්ස්‍ය තහනම තවදුරටත් පවත්වාගෙන යාමට නාරා ආයතනය නිර්දේශ කරන ලදී.

2. ගොඩගසන ලද විශාල සුන්බුන් ඉවත් කරන තුරු ධීවර තහනම තවදුරටත් ක්‍රියාත්මක කළ යුතු බව රජය විසින්, රජය සහ යාත්‍රා හිමිකරු සමාගම අතර අතරමැදියෙකු ලෙස සේවය කරන අයිටීඕපීඑෆ් වෙත නිල වශයෙන් දැනුම් දෙන ලදී.

3. මසුන් ඇල්ලීමේ තහනම දීර්ඝ කර ඇති බැවින්, ධීවර කර්මාන්තයේ නියුතු ධීවරයින්ට සහ අනෙකුත් පාර්ශවයන්ට ජීවනෝපාය අහිමි වීම සඳහා වන්දි ගෙවිය යුතු බව පී ඇන්ඩ් අයි ක්ලබ්, අයිටීඕපීඑෆ්, ජාත්‍යන්තර නීති සමාගම සහ දේශීය නීති සමාගම ඇතුළු යාත්‍රාවේ හිමිකරුගේ නියෝජිතයින්ට පැහැදිලිව දැනුම් දෙන ලදී.

4. නීතිපතිතුමා සහ අයිටීඕපීඑෆ්, සමග සිදුකළ සාකච්ඡාවලින් අනතුරුව එළඹුණු ක්‍රමවේදයන්ට අනුව පීඩාවට පත් වූ පුද්ගලයින් හඳුනා ගැනීම සහ ධීවර කර්මාන්තයේ නියුතු විවිධ වර්ග වල දෛනික ආදායම් අහිමි වීම තක්සේරු කිරීම ග්‍රාම නිලධාරී, ධීවර පරීක්ෂක, ආර්ථික සංවර්ධන නිලධාරී සහ සමෘද්ධි නිලධාරී සහ ප්‍රාදේශීය කමිටු වලින් සමන්විත ගම් මට්ටමේ කමිටු සහ ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික්කයේ සහකාර ධීවර අධ්‍යක්ෂක සහ කතෝලික පූජකතුමන්ලාගේ කොට්ඨාශ මට්ටමෙන් නියෝජිතයෙකුගෙන් සමන්විත විය. අවසාන වශයෙන්, වන්දි ගෙවීම සඳහා දිස්ත්‍රික් ලේකම් සහතික කර නිර්දේශ කරනු ලැබිනි.

5. පීඩාවට පත් වූවන්ට සහන සැලසීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

   I. මෙම විශේෂ දීමනාව ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා පීඩාවට පත් පවුල් සඳහා එක් පවුලකට රු. 5000/= බැගින් ප්‍රදානය කෙරිණි.
   II. නැවේ රක්ෂකයින්ගෙන් ලැබුණු රු. මිලියන 420 ක් පීඩාවට පත් වූවන්ට බෙදා දෙන ලදී.
   III. හානි වූ ධීවර ආම්පන්න වෙනුවට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් නව ආම්පන්න ලබා දෙන ලදී
   IV. රක්ෂණ වන්දි සඳහා ඉල්ලීම් රක්ෂණකරු වෙත ලබා දෙන ලදී. හඳුනාගත් සියලුම හානි සඳහා. රක්ෂණකරුවන්ගෙන් මුදල් ලැබුණු පසු වන්දි මුදල් විපතට පත් වූවන්ට බෙදා දීමට අමාත්‍යාංශය අවශ්‍ය පියවර ගනු ඇත.
   V. සිද්ධියට සම්බන්ධ අනෙකුත් සියලුම රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය සහය ලබා දෙන ලදී.



එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ ගින්නෙන් පසු ධීවර දැල් ආම්පන්න හානියට පත් වූ සියලුම ධීවරයන් වෙනුවෙන් නව දැල් ආම්පන්න ලබා දීම

# 02
# ධීවර
# හා
# ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
















## දැක්ම

ධීවර සහ ජලජ සම්පත් තිරසරභාවයෙන් යුක්තව පවත්වා ගනිමින් ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම හරහා ජාතික ආර්ථිකයට ප්‍රශස්ථ දායකත්වයක් ලබාදීම.

## මෙහෙවර

ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය හරහා ශ්‍රී ලංකා ආර්ථිකයට ඵලදායි දායකත්වයක් ලබාදීමට ජාතික හා ජාත්‍යන්තර නීති හා සම්මුතින්ට අනුකූලව නව තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් ධීවර සහ ජලජ සම්පත් කළමනාකරණය කිරීම.

# කාර්යභාරය

- ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය තිරසාර ලෙස පවත්වා ගෙන යාම උදෙසා ධීවර ප්‍රජා සහභාගීත්වය තුලින් මුහුද, කළපු හා කිවුල්දිය ජලාශවල මත්ස්‍ය සම්පත් සංරක්ෂණය කොට කළමනාකරණය කිරීමේ කාර්යන්
- කාලීන ප්‍රවණතාවයන්ට අනුකූලව නව තාක්ෂණය යොදා ගනිමින් ධීවර කර්මාන්තය තිරසාර ලෙස සංවර්ධනය කිරීම, ජාතික ධීවර සම්මේලනය යටතේ පිහිටුවා ඇති ග්‍රාමීය ධීවර සංවිධාන සහ ධීවර සමුපකාර සමිති පවත්වාගෙන යෑම, ධීවර ගම්මාන ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය, ධීවර ජනතාවගේ සමාජ සුභ සාධනය නඟා සිටුවීම පිණිස විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ධීවර කර්මාන්තය සංවර්ධනය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීමේ වැඩසටහන් සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර යාත්‍රා නිෂ්පාදකයින් හා ධීවර ආම්පන්න, ධීවර යෙදවුම් ,ධීවර යාත්‍රා එන්ජින්, ශීතකරණ, යාත්‍රා චරණ සන්නිවේදන හා ආරක්ෂිත උපකරණ නිපදවන ආයතන ලියාපදිංචි කිරීම හා උපකරණ හා ඇම ආනයන කරුවන් ලියාපදිංචිය හා නියාමනය කිරීම.
- ස්වභාවික විපත් හදිසි අනතුරු හේතුවෙන් අසරණභාවයට පත් ධීවර පවුල් නගා සිටු වීම සඳහා වැඩ සටහන් සකස් කිරීම හා ධීවර විශ්‍රාම වැටුප් හා ධීවර රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- වෙරළාශ්‍රිත ඉදිකිරීම්වලට අදාලව නිර්දේශ ලබාදීම.
- විදේශීය ආධාර මත සිදුවන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය නියාමනය හා ,පසු විපරම් කටයුතු කිරීම.
- විකල්ප ආදායම් උත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඒ සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග ඒකාබද්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- පසු අස්වනු හානි වැළැක්වීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදු කරන ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ධීවර යාත්‍රා මගින් අල්ලා ගත් මසුන් නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර ක්‍රියාකාරකම් වලින් තොරව, නීත්‍යානුකූල, නිවැරදි වාර්තා සහිතව සහ විධිමත් ලෙස අල්ලා ගෙන ඇති බවට සත්‍යතාක්ෂණය කිරීම හා නියාමනය
- මහ මුහුදේ ධීවර මෙහෙයුම් වලට අදාල සියලු ධීවර වරායන්/ගුවන් තොටුපළ තත්ත්ව පාලන ඒකකය, ප්‍රාදේශීය කාර්යාල, යාත්‍රා අධීක්ෂණ මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ වෙරළ ආරක්ෂක බලකාය යන මූලික කොටස්කරුවන්,මත්ස්‍ය අපනයන කරුවන් සහ ජාත්‍යන්තර ධීවර කටයුතු ඒකකය කේන්ද්‍ර කොට ගනිමින් 24*7 සේවා මුර සහිත ජාලගත සම්බන්ධතාවය මගින් සජීවී ව සම්බන්ධීකරණය කිරීම
- කලාපීය සහ දේශීය වශයෙන් ලබා දීමට බැඳී සිටින ධීවර දත්ත නිසි කලට සහ නිවැරදිව ලබාදීම අදාල කාර්යන්
- චන්ද්‍රිකා තාක්ෂණය යොදා ගනිමින් ක්‍රියාත්මක වන යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය තුලින් මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ජාත්‍යන්තර මුහුදේ ධීවර කර්මාන්තයේ නියැලෙන 1500 ක පමණ ධීවර යාත්‍රා ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව ධීවර කර්මාන්තයේ නියලීම් අධීක්ෂණය හා නියාමනය කිරීම.
- ශ්‍රී ලංකා අනන්‍ය ආර්ථික කලාපය හා ඉන් පිටත ධීවර මෙහෙයුම් කටයුතු වල නිරත ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ හුවමාරු සන්නිවේදන පහසුකම් ලබාදීම
- එන්ජින් අක්‍රිය වීම, මුහුදේදී හදිසි අනතුරට ලක්වීම හා හදිසි අසනීප තත්ත්වයන්ට පත්වීම වැනි ව්‍යසනයන්හිදී ධීවර කාර්මිකයින් හා ධීවර යාත්‍රා බේරා ගැනීම, ජීවිත හානි වළක්වා ගැනීමේ කාර්යන් සහ අනතුරුවලදී රක්ෂණ ආවරණ ලබාගැනීමට පහසුකම් සැළසීම.
- ශ්‍රී ලංකාවෙන් ජාත්‍යන්තර වෙළඳපලට අපනයනය කරනු ලබන මත්ස්‍ය නිෂ්පාදන සඳහා ස්වස්ථතා සහතික ලබා දීම සහ එම අපනයන ආයතන නියාමනය කිරීමේ කාර්යයන්
- ධීවර පනත ක්‍රියාත්මක කිරීම සම්පත් කළමනාකරණය තුලින් ධීවර කර්මාන්තය තිරසාර ලෙස සංවර්ධනය කිරීම යන අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා ධීවර ප්‍රජාව, ධීවර නිලධාරී හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ මනා සම්බන්ධතාවය ගොඩනැගීම, පුහුණු වැඩසටහන් හා අවශ්‍ය පහසුකම් සැලසීම

## 1 ධීවර හා ජලජ සම්පත් තිරසාර ලෙස කළමනාකරණය

ධීවර හා ජලජ සම්පත් තිරසාර ලෙස කලමනාකරණය කිරිම හා විධිමත් කිරිම ධීවර දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයක් වන අතර, ඒ සඳහා ධීවර යාත්‍රා, ධීවර මෙහෙයුම් වෙනුවෙන් කළමණාකරන බලපත්‍ර නිකුත් කිරිම්, නිත්‍යානුකූල නොවන, අවිධිමත්, වාර්තා නොවන ධීවර කටයුතු වැලැක්විම සඳහා ක්‍රියාමාර්ග ගැනිම් සිදු කරන අතර 2021වර්ෂයට අදාලව පහත සඳහන් පරිදි විවිධ ධීවර මෙහෙහුම් හා යාත්‍රා සඳහා බලපත්‍ර ලබා දි ඇත.

වගුව **01: 2021** වර්ෂයේ **2021.09.30** දිනටඅදාලව එක් එක් කාර්යන්හි ප්‍රගතිය

| කාර්යය | වාර්ෂික ඉලක්කය | 2021.09.30 දිනට ප්‍රගතිය | ප්‍රගතිය% |
|---|---|---|---|
| මහ මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර නිකුත් කිරිම් (High Seas) | 1,200 | 735 | 61.25 |
| ධීවර නියමු බලපත්‍ර නිකුත් කිරිම් | 1,000 | 500 | 50.00 |
| මාදැල් ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර නිකුත් කිරිම් | 1108 | 720 | 67.90 |
| විසිතුරු මසුන් අපනයන බලපත්‍ර නිකුත් කිරිම් | 65 | 25 | 38.46 |
| විසිතුරු මසුන් ආනයන බලපත්‍ර නිකුත් කිරිම් | 60 | 20 | 33.30 |
| පොකිරිස්සන් අපනයන බලපත්‍ර නිකුත් කිරිම් | 120 | 55 | 45.83 |
| පොකිරිස්සන් ලග තබාගැනිමේ බලපත්‍ර නිකුත් කිරිම් | 20 | 4 | 20.00 |
| හක්බෙල්ලන් අපනයන බලපත්‍ර නිකුත් කිරිම් | 30 | 23 | 76.66 |
| හක් බෙල්ලන් ප්‍රවාහනය කිරිමේ සහ ලගතබාගැනිමේ බලපත්‍ර නිකුත් කිරිම් | 75 | 40 | 53.33 |
| මුහුදු කුඩැල්ලන් අපනයන බලපත්‍ර නිකුත් කිරිම් | 120 | 46 | 38.30 |
| මුහුදු කුඩැල්ලන් ප්‍රවාහනය සහ ලග තබාගැනිමේ බලපත්‍ර නිකුත් කිරිම් | 180 | 79 | 43.88 |
| කෘත්‍රිම උපස්තර මත වගා කරන ලද ජලජ ජිවින් වගාකිරිම සඳහා අපනයන බලපත්‍ර ලබාදිම(export permits to cultured marine organism on artificial substrates) | 04 | 01 | 25.00 |
| මුහුදු කවච සඳහා ප්‍රවාහන බලපත්‍ර ලබාදිම(transport permits to sea shells for ornament) | 30 | 5 | 16.60 |

## 2 තත්වපාලනය මගින් මත්ස්‍ය අපනයනයේදි අදාල ප්‍රමිතින් පවත්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනිම

මත්ස්‍ය අපනයනය මගින් සැලකිය යුතු විදේශ විනිමයක් ලබා ගැනිමේ අවකාශය පවතින අතර එහිදි මත්ස්‍ය නිෂ්පාදනවල ප්‍රමිතින් පවත්වා ගැනිම වැදගත් වේ. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ තත්වපාලන අංශය මගින් මත්ස්‍ය අපනයනයේදි අදාල ප්‍රමිතින් පවත්වා ගැනිමට අදාලව බලපත්‍ර නිකුත් කිරිම් සහ එම ආයතන පරික්ෂා කිරිම් සිදු කරන අතර එහි ප්‍රගතිය පහත පරිදි වේ.

වගුව **02: 2021**වර්ෂයේ **2021.09.30** දිනට අදාලව මත්ස්‍ය තත්ත්ව පාලන කටයුතුවල ප්‍රගතිය

| කාර්යය | වාර්ෂික ඉලක්කය Q2 | ප්‍රගතිය | ප්‍රගතිය % |
|---|---|---|---|
| මත්ස්‍ය පිරිසැකසුම් ආයතන සහ පරීක්ෂණාගාර සඳහා අනුමැතියන් ලබාදීම | 18 | 18 | **100.00** |
| යුරෝපා රටවල් සඳහා ස්වස්තරා සහතික නිකුත් කිරිම | 6,000 | 8,242 | 137.36 |
| මසුන් ඇල්ලීමේ සහතික නිකුත් කිරිම | 3,000 | 3,143 | 104.76 |
| යුරෝපා නොවන රටවල් සඳහා ස්වස්තරා සහතික නිකුත් කිරිම | 5,000 | 3,204 | 64.08 |
| පරීක්ෂණාගාර පරීක්ෂා කිරිම | 2 | 0 | 0 |
| මත්ස්‍ය සැකසුම් ආයතන පරීක්ෂාකිරිම | 45 | 15 | 33.33 |
| මත්ස්‍ය ඇසුරුම් ආයතන පරීක්ෂාව | 4 | 4 | **100.00** |
| පොකිරිස්සන් එක්රැස්කරන ස්ථාන පරීක්ෂාව | 4 | **0** | 0 |
| ධීවර වරායන් හා මසුන් ගොඩබෑමේ ස්ථාන පරීක්ෂාව | 4 | 0 | 0 |
| දේශීය හා විදේශීය ධීවර යාත්‍රා පරීක්ෂාව | 25 | 0 | 0 |
| මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන සඳහා නිල සාම්පල පරීක්ෂාව (ජලය අයිස් මත්ස්‍ය නිෂ්පාදන) | 150 | 0 | 0 |
| ධීවර වරාය වල ජලය හා අයිස් පරීක්ෂාව | 9 | 0 | 0 |
| ඉස්සන් ගොවිපළවල (ප්‍රතිජීවක ඖෂධ/මැලකයිට් ග්‍රීන් /කෘමි නාශක අවශේෂ) ආදිය පරීක්ෂාව | 20 | 0 | 0 |
| අපනයනය සඳහා සැකසූ මසුන්ගේ අහඹු ඉන්ද්‍රිය විභාජක පරීක්ෂාව | 20 | 0 | 0 |
| ඉස්සන් ගොවිපළ පරීක්ෂාව | 10 | 0 | 0 |
| ගුවන්තොටුපළේදී ආනයන මත්ස්‍ය තොග ක්ෂණික පරීක්ෂාව | 25 | 0 | 0 |

(සැ. යු. - රටේ පැවති වසංගත තත්ත්වය මත ආයතන විසින් පනවා තිබූ දැඩි සෞඛ්‍ය ආරක්ෂක පිළිවෙත් හා අප ආයතනය පිලිපැදි සෞඛ්‍ය ආරක්ෂක පිළිවෙත් නිසා ක්ෂේත්‍ර රාජකාරී සීමාකිරිමට සිදුවූ අතර බොහෝ ආයතන පරීක්ෂණ කටයුතු සිදුකරනලද්දේ ONLINE තාක්ෂණය ඔස්සේ වන අතර ක්ශේත්ත්‍ර රාජකාරීන්ට අදාල ඉල්ලක්ක පහත වැටීම සිදුවී ඇතිබව අවධානට යොමු කරමු.)

## 3 වෙරළාශ්‍රිත මුහුදු තීරයේ මත්ස්‍ය ගහනය වැඩි කිරීම සඳහා අබලි වාහන භාවිතයෙන් ඇටවුම් යෙදවීම

නව රජයේ අමාත්‍යංශය සඳහා විෂය පථයන් වෙන් කරන ගැසට් පත්‍රයට අනුව සුවිශේෂි ප්‍රමුඛතා ලෙස වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක  ක්‍රම හඳුන්වාදීම පළමු කාර්යය ලෙස දක්වා ඇත .මේ අනුව රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ධීවර අමාත්‍යතුමාගේ හා රාජ්‍ය අමාත්‍යතුමාගේ මඟපෙන්වීම් හා උපදෙස් මත ධීවර ක්ෂේත්‍රයට අදාලව වෙරළාසන්න සමුද්‍රිය පරිසර පද්ධතිය, සමුද්‍රිය ජෛව විවිධත්වය අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කරලීම උදෙසා සමුද්‍රිය ජෛව විවිධත්වය ඉහළ නැංවීම සඳහා

වෙරළාසන්න මුහුදු පත්ලෙහි කෘත්‍රිම උපස්ථර මත මත්ස්‍ය අභිජනන ස්ථාන ඇතිකිරීම අරමුණු කර ගෙන සැලසුම් කර ඇති මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී.

තවද භාවිතයෙන් ඉවත්කළ බහුදින ධීවර යාත්‍රා, දුම්රිය මැදිරි සහ බස්රථ සැකිලි විශාල ප්‍රමාණයක් නිකරුණේ දිරාපත් වෙමින් පවතිනු දක්නට ලැබෙන අතර, එය එම ආයතන වලටද ගැටලුවක්ව පවතී. එම ද්‍රව්‍ය රඳවා තබා ගැනීම සඳහා විශාල ඉඩප්‍රමාණයක් වෙන්කිරීමට සිදුවීම මෙන්ම ඩෙංගු උවදුර ව්‍යාප්ත වීම වැනි පාරිසරික ගැටලු ද මෙම ද්‍රව්‍ය නිකරුණේ රඳවා ගැනීම හේතුවෙන් සිදුවේ .භාවිතයෙන් ඉවත්කළ.එවැනි ව්‍යුහයන් පරිසරයට හානියක් නොවනසේ සාගරයේ තැන්පත් කර කෘතිම උපස්ථරයක් ලෙස යොදා ගැනීම ඉතා සුදුසු බව හඳුනාගෙන ඇත.

අත හැර දැමූ යාත්‍රා හා බස් රථ ඇණි යොදාගෙන කෘත්‍රිම සමුද්‍ර පරිසර පද්ධති නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය ගාල්ල ධීවර දිස්ත්‍රික්කයේ අවසාන කර ඇත. මෙහිදී බෝට්ටු 6ක් හා බස් රථ 24 ක් ගිල්වා ඇති අතර 2 වන අදියර නිල්වැල්ල,මාතරදී බස් රථ 1 සහ අතහැර දැමූ යාත්‍රා 1ගිල්වා ඇත. තුන්වන අදියරයේදි යාපනය මුහුදේ බස් 38 සහ ත්‍රිකුණාමල මුහුදේ බස් රථ 24 සහ අතහැර දැමූ යාත්‍රා 12ක්ගිල්වා ඇත. මෙමගින් ජලජ ජීවීන්ට අවශ්‍ය වාසස්ථාන මෙන්ම අභිජනන හා පෝෂක බිම් සැපයීම සිදු කළ හැකිය. ආහාර ජාල සහ ආහාර දාම නිසි පරිදි ක්‍රියාත්මක වීමෙන් ඒ ආශ්‍රිතව ජෛව සනත්වය හා විවිධත්වය ඉහළ නැංවීමත් මෙයින් අපේක්ෂා කෙරේ.




ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් ගාල්ල ව්‍යාපෘතිය ආරම්භ කිරීම සහ නිරීක්ෂණය





ගාල්ල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම






නිල්වැල්ල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

## 4 කරවල නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන තෝරාගත් කාන්තාවන් 25ක් සඳහා තත්ත්වයෙන් උසස් නිෂ්පාදනයක් සඳහා අවශ්‍ය උපකරණ ලබාදීමේ නියමු ව්‍යාපෘතිය

2021 ධීවර අමාත්‍යාංශයෙන් ලබා දෙන ධීවර ප්‍රජාව බලගැන්වීම ශිර්ෂය යටතේ ධීවර කාන්තා සමිති සාමාජිකයන් ශක්තිමත් කිරිම සඳහා ලබාදෙන ප්‍රතිපාදන වලින් මිලියන 4ක් තෝරාගත් දිස්ත්‍රික්කවල නියමු ව්‍යාපෘතියක් ලෙස කරවල නිෂ්පාදනයේ යෙදෙන කාන්තාවන් 72ක් සඳහා අවශ්‍ය උපකරණ කට්ටල ලබා දිම යෝජනා කෙරේ. උපකරණ කට්ටලය(එක් කට්ටලයක් සඳහා දළ ඇස්තමේන්තුව 55,000/=)

අරමුණු:

- කරවල නිෂ්පාදන වල ගුණාත්මක බව හා සෞඛ්‍ය ආරක්ෂිත බව තහවුරු කිරිම .
- ධීවරයන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම.
- දේශීය පාරිභෝගිකයා වෙත වඩාත් ගුණාත්මක නිෂ්පාදන ලබාදීම.
- ආදර්ශ නියමු ව්‍යාපෘතියක් මගින් තත්ත්වයෙන් උසස් නිෂ්පාදනයක් සිදුකිරිම මගින් කර්මාන්තයේ යෙදෙන සෙසු නිෂ්පාදකයන්ද ඒ සඳහා යොමු කරවීම.

## 5 මත්ස්‍ය පසු අස්වනු හානිය අවම කිරිම සඳහා පහසුකම් සැලසීම

වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් දේශීය වෙළෙඳපොළට ලැබෙන දායකත්වය 70%ක් වන අතර, අපනයන වෙළඳපොළ සඳහා 7% ක දායකත්වයක්ද ලැබේ. එසේම නිවැරදි පරිහරණය ක්‍රමවේදය භාවිතා නොකිරිම හේතුවෙන් මත්ස්‍ය නිෂ්පාදනයෙන් දළ වශයෙන් 20% -30% අතර වූ පසු අස්වනු හානියක් සිදුවන බවට ගණනය කර ඇත. මෙම පසු අස්වනු හානිය අවම කරමින් ගුණාත්මක තත්වයෙන් ඉහළ මත්ස්‍ය නිෂ්පාදන වෙළඳපලට ලබාදීම සඳහා නිවැරදි පරිහරණය ක්‍රමවේද පිළිබඳ දැනුවත් කිරිම මෙන්ම,ධීවරයින් සඳහා අවශ්‍ය පහසුකම් ද ලබා දීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

මේ සඳහා රුපියල් මිලියන 8ක ප්‍රතිපාදන වෙන් වී ඇති අතර, මේ යටතේ ධීවර දිස්ත්‍රික්ක 15 ම ආවරණය වන පරිදි එම දිස්ත්‍රික්කවල පවතින OFRP යාත්‍රා සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ඒ අනුව සාධාරණ ලෙස බෙදී යන ආකාරය හා 2020 වර්ෂයේ ඇසුරුම් පෙට්ටි බෙදා දුන් ආකාරයද සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාවේ සියලුම ධීවර දිස්ත්‍රික්ක වලට සාධාරණය සිදුවන පරිදි OFRP ධීවර යාත්‍රා සඳහා ඇසුරුම් පෙට්ටි 200ක් හෝ ඒ අවස්ථාවේ පවතින මිල ගන්න යටතේ 25 % දායකත්වයද ඇතුලත්ව ලබා ගත හැකි උපරිම මත්ස්‍ය ඇසුරුම් පෙට්ටි සංඛ්‍යාව මිලදී ගැනීම මෙමගින් සිදු කරයි.

අරමුණු:

- ධීවර නිෂ්පාදන වල ගුණාත්මක බව හා සෞඛ්‍ය ආරක්ෂිත බව තහවුරු කිරීම .
- කුඩා යාත්‍රා මගින් නෙලා ගන්නා මත්ස්‍ය නිෂ්පාදනවල පසු අස්වනු හානි අවම කිරීම.
- ධීවරයන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම.
- දේශීය පාරිභෝගිකයා වෙත වඩාත් ගුණාත්මක නිෂ්පාදනය ලබාදීම.

## 6 සමුපකාර සමිති ප්‍රතිසංවිධානය කිරිම

ධීවර සමුපකාර සමිති ප්‍රතිසංවිධානය කිරිම යටතේ අක්‍රිය ධීවර සමිති නැවත පිහිටුවීමටත් සමුපකාර කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීමටත් කටයුතු සැලසුම් කර තිබුනද රට පුරා පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. එබැවින් දැනට ක්‍රියාත්මක සංවර්ධනය කළ යුතු ධීවර සමුපකාර සමිති තෝරා එම සමුපකාරවල පවතින අවශ්‍යතා සපුරාලීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් යෝජනා කැඳවීම සිදු කොට ඇත. එමෙන්ම සමුපකාර දෙපාර්තමේන්තුව සමග එක්ව ධීවර සමුපකාර සමිති සඳහා අවශ්‍ය පොත් පත් ලේඛන ලබා දීමද සිදු කෙරේ.

## 7 කලපු මත්ස්‍ය ගහණය ඉහළ නැංවීම

රුපියල් මිලියන 2.2 ක ප්‍රතිපාදන වැයකර යාපනය දිස්ත්‍රික්කයේ තොන්ඩමන් ආරු කලපුවේ කරඅඩු ඉස්සන් පැටවුන් මිලියන 4 ක් හා රු.මිලියන 0.825 ක ප්‍රතිපාදන වැය කර මඩකලපුව කලපුවේ කරඅඩු ඉස්සන් පැටවුන් මිලියන 1.5 ක් තැන්පත් කර ඇත.



කර අඩු ඉස්සන් පැටවුන් මිලියන 4ක් මුදාහැරීම

## 8 මෝදා මත්ස්‍ය වගාව

පුත්තලම කලපුවේ මෝදා මත්ස්‍ය කූඩුවල මෝදා මත්ස්‍ය පැටවුන් 14,000 ක් තැන්පත් කර ඇත.

## 9 කලපු සීමා නිර්ණය කිරිම

කලපු සීමා නිර්ණය කිරිම සඳහා රුපියල් මිලියන 11 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර මෙතෙක් අරුගම්බේ, ලංකාපටුන, හලාවත, මුන්දලම, රැකව, කෝකිලායි යන කලපු වල සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් මායිම් කණු 4,660 ක් සිටුවා ඇත.



මායිම් කණු



මයිම් කණු රැගෙන යාම



මායිම් කණු සිටුවීම



මායිම් කණු සිටුවීම නිරීක්ෂණය

## 10 කලපු පිරිසිදු කිරිම හා ගැඹුරු කිරිම

මුලතිව් දිස්ත්‍රික්කයේ නන්දිකඩාල් කලපුවේ ධීවර කර්මාන්තය ආශ්‍රිත සංවර්ධන කටයුතු සම්බන්ධව ජාතික ජලජ සම්පත් පර්යේෂණ නියෝජිතායතනය විසින් මූලික පාරිසරික ඇගයීම් වාර්තාවක් සකස් කර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. මෙහි පළමු තාක්ෂණික කමිටු රැස්වීම පවත්වා ඇත.

නයාරු කලපුවේ ධීවර කර්මාන්තය ආශ්‍රිත සංවර්ධන කටයුතු සම්බන්ධ වාර්තාව ජාතික ජලජ සම්පත් පර්යේෂණ නියෝජිතායතනය විසින් සකස් කරමින් පවතී.

රැකව කලපුවේ කපුහේන්දිවල පාලම යට අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර දෙන ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.

## 11 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යයන් ජාලගත කිරීමේ වැඩසටහන

වඩා කාර්යක්ෂම හා විනිවිදභාවයකින් යුතුව සේවාලාභීන් වෙත පහසුකම් සැලසීමේ අරමුණින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ විවිධ වූ කාර්යයන් ජාලගත කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.ඒ අනුව ජාලගත වීමට ලක්වන ප්‍රධාන ක්‍රියාවලින්පහත පරිදි වේ.

- දැනට කඩදාසි මාධ්‍යයෙන් සිදු කෙරෙන ලියාපදිංචි කිරීම් හා මෙහෙයුම් බලපත්‍ර සියල්ල තොරතුරු ජාලයක් ඔස්සේ නිකුත් කෙරෙනු ඇත.
- දැනට කඩදාසි මාධ්‍යයෙන් සිදු කෙරෙන අනෙකුත් රාජකාරීන් 20ක් පමණ ආවරණය කෙරේ.
- දැනට කඩදාසි මාධ්‍යයෙන් සිදු කෙරෙන මත්ස්‍ය නිෂ්පාදන හා විද්‍යාත්මක දත්ත සියල්ල තොරතුරු ජාලය ඔස්සේ ලබාගනී.එම දත්ත සඳහා පිවිසුම් නාරා ආයතනයට සහ සංඛ්‍යාලේඛණ අංශයට ලබාදෙනු ඇත.
- දෙපාර්තමේන්තුව තුල ලිපි ගනුදෙනු සියල්ල ජාල ගත කෙරෙනු ඇත.
- නිලධාරීන් අධීක්ෂණය කිරීමේ පද්ධතියක් පිහිටුවෙනු ඇත.




ජාලගත කිරීමේ වැඩසටහන

දෙපාර්තමේන්තු ජාල මෘදුකාංගය සංවර්ධනය කරනුයේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් 15 කට වැඩි ප්‍රමාණයක් ඩිජිටල් ක්‍රියාවලියක් බවට පරිවර්තනය කිරීමටයි, බෝට්ටු ලියාපදිංචි කිරීම,විද්‍යාත්මක දත්ත රැස් කිරීම යනාදිය හා තවත් බොහෝ ක්‍රියාදාම ඊට ඇතුලත්ය. දෙපාර්තමේන්තුජාල මෘදුකාංගයට ප්‍රධාන අංග දෙකක් ඇත, ඇන්ඩ්‍රොයිඩ් (android) යෙදවුම හා ජාවා යෙදවුම එම ප්‍රධාන අංගයන් වේ.
දෙපාර්තමේන්තු ජාල මෘදුකාංග භාවිතා කරමින් ධීවරයින් 45,000 කට ප්‍රමාණයක් මේ වනවිටත් ලියාපදිංචි කර ඇති අතර 2020 වර්ෂයේ සිට දෙපාර්තමේන්තු ජාල මෘදුකාංග තුළ ගොඩනගා ඇති අනෙකුත් සියලුම ක්‍රියාදාමයන් ආරම්භ කර ඇත.

මේ යටතේ 2021 වර්ෂය පුරා යාත්‍රා පිටත්වීම් 50,000 කට අධික ප්‍රමාණයක් ලබාදුන් අතර, නව යාත්‍රා අංක 95ක් යාත්‍රා නව ලියාපදිංචි කිරීම් 102ක් යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචිය අලුත් කිරීම් 60ක් මහ මුහුදේ මසුන් ඇල්ලීමේ බලපත්‍ර 900ක් පමණ නිකුත් කර ඇත. එමෙන්ම ධීවර හැඳුනුම්පත් 30,000කට අධික ප්‍රමාණයක් මුද්‍රණය කර බෙදා හැර ඇත. බහුදින යාත්‍රා මෙහෙයුම් පිලිබඳ සියලු කටයුතු මේ වන විට පද්ධතිය මගින් ඉටුකෙරේ. එමෙන්ම පද්ධතිය ක්‍රියාත්මක වීමට අවශ්‍ය දත්ත සියල්ලම පද්ධතියට සංක්‍රමණය (Migration) කර ඇත.

## 11.1 දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය.

www.fisheriesdept.gov.lk.




දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය.

දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ  නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ අංශය වගකීම දරයි. දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය දිනපතා යාවත්කාලින වන අතර දෙපාර්තමේන්තු ක්‍රියාදාමයන් පිළිබඳ විස්තර එහි ඇතුලත් වේ .සියලුම ලියාපදිංචි අපනයනකරුවන්,ආනයනකරුවන් ,අංගන සහ සැපයුම්කරුවන්ගේ ලැයිසතුවක්ද වෙබ් අඩවිය තුල පවත්වාගෙන යනු ලබන අතර එය නිරන්තරයෙන් යාවත්කාලින වේ. වෙබ් අඩවියේ ඇති ප්‍රවේශ හරහා නිලධාරීන්ට දෙපාර්තමේන්තුවේ පද්ධතියට ප්‍රවේශ විය හැක. 2020 වර්ෂයේ bestweb.lk තරගාවලියේ රන් පදක්කමක් මෙම වෙබ් අඩවිය විසින් දිනා ගන්නා ලදී.

## 11.2 නිලධාරීන්ගේ නිල විද්‍යුත් තැපැල් ගිණුම් සකස් කිරීම.




නිලධාරීන්ගේ නිල විද්‍යුත් තැපැල් ගිණුම්

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සියලුම මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ විද්‍යුත් තැපැල් ගිණුම් මේ වන විටත් අවසන් කර ඇති අතර ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල කටයුතු මේ හරහා සම්බන්ධීකරණය කෙරේ.

විශේෂයෙන් මෘදුකාංග යාවත්කාලීන කිරීම, මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් දැනුවත් කිරීම සහ ප්‍රධාන කාර්යාලයේ විශේෂ හදිසි තොරතුරු දැනුම්දීම් විද්‍යුත් තැපැල් නිලධාරීන්ගේ ගිණුම් මගින් සිදු කරනු ලැබේ, දැනට සියලුම මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ ගිණුම් සකස් කර ඇත.

## 11.3. ලේඛන කළමනාකරණ පද්ධතිය (ඩීඑම්එස්) ක්‍රියාත්මක කිරීම පුහුණු කිරීම




ලේඛන කළමනාකරණ පද්ධතිය

තොරතුරු  තාක්ෂණ අංශය දෙපර්තම්නේතුවේ ක්වුඩ්ස් (cloud)ඩොක්ස්ප්‍රෝ (Doxpro )ලේඛන කළමනාකරණ පද්ධතියක් මිලදී ගෙන ක්‍රියාත්මක කරමින් පවතී .මේ පිලිබදව අංශ ප්‍රධානීන්ට මූලික පුහුණුවක් ලබා දී ඇත 2020 ආරම්භයේ සිට ලේඛන කළමනාකරණ පද්ධතිය ආරම්භ කර ඇත .වසර දෙකක් තුල ලේඛන කළමනාකරණ පද්ධතිය භාවිත කරමින් දෙපාර්තමේන්තුවේ කඩදාසි භාවිතය 90% කින් අඩු කිරීම අපේක්ෂා කරයි .2020 සහ 2021 වර්ෂවල බලපවත්වන ලද කොවිඩ් 19 වසංගත තත්වය නිසා බොහෝ අවස්ථාවල නිලධාරීන් නිවසේ සිට රාජකාරීන් සිදුකිරීම . මෙහිදී doxporo පද්ධතිය මගින් රාජකාරි ලිපි 500කට අධික ප්‍රමාණයක් ක්‍රියාත්මක කරන ලදී.

## 11.4 විද්‍යුත් පණිවුඩ පද්ධතිය සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

දෙපාර්තමේන්තුව තුලඇති සම්පත් භාවිතා කිරීම සම්බන්ධ online පද්ධති 12ක් පමණ මේ වන විට ක්‍රියාත්මක වේ.

## 12. විශේෂ වැඩසටහන්

### 12.1 ධීවර කර්මාන්තයේ යෙදී සිටියදී ස්වභාවික ආපදාවන්ට ලක්ව ජීවිත හානි සිදුවූ ධීවර කාර්මිකයන් ගේ පවුල් වල සාමාජිකයින් හට වන්දි ලබාදීම

ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය අන්තරාකාරී රැකියාවක් වශයෙන් ලෝක කම්කරු සංවිධානය ප්‍රකාශයට පත්කර ඇති අතර ශ්‍රී ලංකාවේ අන්තරාකාරී රැකියා ලේඛනයට අනුව ද මෙය දැඩි අවධානම් රැකියාවක් ලෙස නම් කර ඇත .ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවර කාර්මිකයින්ගෙන් සාමාන්‍යයෙන් වසරකට පුද්ගලයින් 10-25 ප්‍රමාණයක් මුහුදේදී සිදුවන විවිධ අනතුරු නිසා අතුරුදහන් වීම් වලට හෝ තම ජීවිත අහිමි වීම වලට ලක්වන බව වාර්තා වේ. එමෙන්ම තමන්ගේ ධීවර යාත්‍රාවලට සිදුවන හානි නිසා වසරකට යාත්‍රා 20 ක් පමණ (2020 වසරේ ධීවර කාර්මිකයින් 98 සමග යාත්‍රා 19 ක් )වෙනත් රටවල මුහුදු තිර හෝ වෙරළ කරා ගමන් කර තම ජීවිතය බේරා ගත් අවස්ථා රාශියක් වාර්ෂිකව වාර්තා වේ.

2020 වසර තුලදී විවිධ ස්වාභාවික විපත් හේතුවෙන් ජීවිතය අහිමු වූ මීගමුව, කොළඹ, කලුතර හා ත්‍රිකුණාමලයේ ධීවර කාර්මිකයන් 5 දෙනෙකු වෙනුවෙන් ඔවුන්ගේ යැපෙන්නන් සඳහා මිලියනය බැගින් රුපියල් මිලියන පහක වන්දි මුදල් ලබා දීම මෙම වසර තුළ සිදු කරන ලදි.





වන්දි පිරිනැමීම

### 12.2 බහුදින ධීවර යාත්‍රා සඳහා ධීවර යාත්‍රා නිරීක්ෂණ උපකරණ 4200 ක් (VMS) සවි කිරීම

ඕස්ට්‍රේලියානු රජයේ පූර්ණ පරිත්‍යාගයක් ලෙස ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 5.2ක මුදලක් වැය කර මිලදී ගන්නා ලද යාත්‍රා නිරීක්ෂණ උපකරණ (VMS - Vessel Monitoring System) 4200ක් ශ්‍රී ලංකා රජයට භාර දෙන ලදි. මෙම උපකරණ සියලුම බහු දින යාත්‍රාවලට සවි කිරීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව අනිවාර්ය කර ඇති අතර, ඉදිරියේදී මෙම උපකරණ පද්ධතිය නොමැති යාත්‍රා වෙනුවෙන් ගමන් වාර නිකුත් කරනු නොලැබේ. මෙයට අමතරව දැනට මෙම උපකරණ සවි කර ක්‍රියාත්මක නොවන යාත්‍රා සහ කුඩා යාත්‍රාවලටද ඉදිරියේදී නව උපකරණ සවි කිරීමට අපේක්ෂිතය. මෙම උපකරණ සවි කිරීමෙන් ධීවර යාත්‍රා සහ එහි කාර්ය මණ්ඩලවල ආරක්ෂාව

වෙනුවෙන් කටයුතු කිරීම, ජාත්‍යන්තර සහ දේශීය මුහුදු සීමා උල්ලංඝණය වැලැක්වීම, මත්ද්‍රව්‍ය ප්‍රවාහනය මැඩ පැවැත්වීම ඇතුළු අනෙකුත් නීති විරෝධී මුහුදු ප්‍රවාහන සහ බෙදා හැරීමේ කටයුතු වැලක්විමටද ඉවහල් වනු ඇත.

වසර ගණනාවක් සිට යුරෝපා සංගමය ඇතුළු ධීවර කටයුතු පිළිබඳව කටයුතු කරන නියෝජිත ආයතන නිර්දේශ කල බහුදින ධීවර යාත්‍රා නිරීක්ෂණ උපකරණ මෙරට තිබෙන බහුදින යාත්‍රා 4200කට සවි කිරීමේ කටයුතු දික්ඕවිට ධීවර වරායෙන් 2021.09.08 දින  උද්‍යසන ආරම්භ කරන ලදි. මෙම උපකරණය මගින් මුහුදු ගමන් මාර්ගය නිශ්චිත ලෙස හඳුනා ගැනීමට, ජාත්‍යන්තර මුහුදු සීමා උල්ලංගණය කරනවිට දැනුවත් වීමට, ආපදා තත්වයකදී සහය ලබා ගැනීමට සහ එම යාත්‍රාවේ නිශ්චිත ස්ථානය දැන ගැනීමට, රටේ ආරක්ෂාවට තර්ජනයක් වන සහ මත්ද්‍රව්‍ය ඇතුළු ජාවාරම් සිදු කරන යාත්‍රා හඳුනාගැනීමට පහසු වනු ඇත. මෙහි මෙහෙයුම් මධ්‍යස්ථානය ධීවර දෙපාර්තමේන්තුවේ සිට පැය 24 පුරා නිරීක්ෂණය කරන අතර නාවික හමුදාවට සහ ආරක්ෂක අමාත්‍යාංශයටද නිරීක්ෂණය කිරීමට පහසුකම් සැපයෙනු ඇත. මෙම උපකරණය වෙනුවෙන් ලබා දෙන වාර්ෂික සේවා ගාස්තුවද පැවති යන්ත්‍රවල සේවා ගස්තුවලටද අඩු මුදලකි. මෙය ඕස්ට්‍රේලියානු රජයේ පූර්ණ ආධාර මුදලක් යටතේ IOM ජාත්‍යන්තර සංවිධානය විසින් ඩොලර් මිලියන 5කට ආසන්න මුදලක් වැය කර ශ්‍රී ලංකා රජය වෙත ලබා දුන් පරිත්‍යාගයකි. මෙම අවස්ථාව එම දිනයේ සංකේතාත්මකව ගරු ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්දා මැතිතුමාගේ සහභාගීත්වයෙන් දික්ඕවිට වරායේදී සිදු කරන ලදි.



ජනාධිපති සමඟ පැවති සාකච්ඡාව



යාත්‍රා නිරීක්ෂණ උපකරණ කට්ටල පරීක්ෂාව

# ඕස්ට්‍රේලියාවෙන් යාත්‍රා නිරීක්ෂණ උපකරණ පරිත්‍යාගයක්



**නිපුනි ඒකනායක**


ඕස්ට්‍රේලියානු රජයේ පූර්ණ පරිත්‍යාගයක් ලෙස ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 5.2ක මුදලක් වැය කර මිලදී ගන්නා ලද යාත්‍රා නිරීක්ෂණ උපකරණ (VMS - Vessel Monitoring System) 4200ක් පසුගියදා ශ්‍රී ලංකා රජයට භාර දී ඇත.

මෙම උපකරණ සියලුම බහුදින යාත්‍රාවලට සවි කිරීම ධීවර දෙපාර්තමේන්තුව අනිවාර්යය කර තිබේ. ඉදිරියේදී මෙම උපකරණ පද්ධතිය නොමැති යාත්‍රා වෙනුවෙන් ගමන් වාර නිකුත් කරනු නොලැබේ. මෙයට අමතරව දැනට මෙම උපකරණ සවිකර ක්‍රියාත්මක නොවන යාත්‍රා සහ කුඩා යාත්‍රාවලටද ඉදිරියේදී නව උපකරණ සවි කිරීමට අපේක්ෂිතය.

ධීවර යාත්‍රා සහ එහි කාර්ය මණ්ඩලවල ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීම, ජාත්‍යන්තර සහ දේශීය මුහුදු සීමා උල්ලංඝනය වැළැක්වීම, මත්ද්‍රව්‍ය ප්‍රවාහනය මැඩපැවැත්වීම ඇතුළු අනෙකුත් නීති විරෝධී මුහුදු ප්‍රවාහන සහ බෙදා හැරීමේ කටයුතු වැළැක්වීමටද මෙම උපකරණ ඉවහල්වනු ඇත.



නිල වශයෙන් භාරදීම ජනාධිපති කාර්යාලය




යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය













දික්ඕවිට වරායේ සවිකිරීම

## 12.3 මැයි මස සිදු වූ එක්ස්ප්‍රස් පර්ල් භාණ්ඩ ප්‍රවාහන නෞකාව ගිනිගැනීමේ සිද්ධිය හේතුවෙන් ධීවර ක්ෂේත්‍රයට සිදුවූ බලපෑම නියාමනය සඳහා ගනු ලැබූ ක්‍රියා මාර්ගවල ප්‍රගතිය

- මැයි මස21 වැනි දින මෙම සිදුවීම වාර්තා වීමත් සමග ක්‍රියාත්මක වූ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සෘජු බලපෑමට ලක්විය හැකි ධීවර දිස්ත්‍රික්ක වන ගම්පහ(මීගමුව) හා කොළඹ ධීවර දිස්ත්‍රික්ක වල ධීවර කර්මාන්තයේ යෙදීම තාවකාලිකව නවතා දැමීමට තීරණය කර ඒ පිළිබඳ ධීවර ප්‍රජාව දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී .

- එයට අමතරව දික්ඕවිට ධීවර වරාය වෙත මසුන් ගොඩබෑම සඳහා පැමිණෙමින් තිබූ යාත්‍රා වල ගමන් මාර්ගය වෙනස් කර එම යාත්‍රා වලට වඩාත් සුරක්ෂිතව ගොඩබිම වෙත යොමු කිරීමට අවශ්‍ය පියවර ගුවන් විදුලි පණිවිඩ හුවමාරු මධ්‍යස්ථාන හා ධීවර මෙහෙයුම් අංශය එකාබද්ධව කරන ලදී. එමෙන්ම මෙම දිස්ත්‍රික්ක ආශ්‍රිතව වඩාත් සංවේදී ජලජ පරිසර පද්ධති හැඳුනාගැනීමටත් එසේ හඳුනාගත් පරිසර පද්ධති ආරක්ෂා කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන සම්බන්ධීකරණ කටයුතු කඩිනමින් සිදු කිරීමත් සිදු කරන ලදී . එහිදී මීගමුව කලපුව මුහුද සමඟ සම්බන්ධ වන මෝය කට හරහා ආරක්ෂිත දැලක් යෙදීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

වගුව 03 : බලපෑමට ලක්වූ ධීවරයින් පිළිබඳ තොරතුරු

| දිස්ත්‍රික්කය | සෘජු බලපෑමට ලක්වූ ධීවර පරීක්ෂක කොට්ඨාශ සංඛ්‍යාව | සක්‍රිය ධීවර කාර්මිකයින් සංඛ්‍යාව | බලපෑමට ලක්වූ ධීවර යාත්‍රා |
|---|---|---|---|
| මීගමුව | 13 | 9500 | IMUL40<br>IDAY60<br>OFRP2015<br>NTRB 1484<br>MTRB02 |
| කොළඹ | 10 | 2300 | IMUL11<br>IDAY14<br>OFRP446<br>NTRB294<br>MTRB01 |
| කළුතර | 02 | 500 | OFRP47<br>NTRB 33 |

[බහුදින ධීවර යාත්‍රා-(IMUL), එක් දින ධීවර යාත්‍රා(1DAY), පිටත එන්ජින් සහිත එක් දින ධීවර යාත්‍රා-(OFRP), පාරම්පරික ධීවර යාත්‍රා-(NTRB), යාන්ත්‍රීකරණය කල පාරම්පරික ධීවර යාත්‍රා-(MTRB)]

- මෙම සිද්ධියට සමගාමීව කුඩා හා මහා පරිමාණ මත්ස්‍ය වෙළඳාම, අයිස් සැපයුම්කරුවන්, අගය එකතු කල මත්ස්‍ය නිෂ්පාදකයින්, අගය එකතු කල මත්ස්‍ය නිෂ්පාදන වෙළෙන්දන්, කරදිය සුරතල් මසුන් එකතු කරන්නන්, මත්ස්‍ය අපනයනකරුවන්, අපනයනය සඳහා මත්ස්‍ය විශේෂ එකතු කරන්නන්, යාත්‍රා සඳහා අවශ්‍යතා සැපයුම්කරුවන්, දැල් පිළිසකර කරන්නන්, යාත්‍රා හා එන්ජින් අලුත්වැඩියාවන් සිදකරන්නන් වැනි ධීවර ආශ්‍රිත රැකියා රාශියක් අවදාමට ලක්විය.

- මෙම සිද්ධියෙන් ක්ෂණිකව සෘජු බලපෑමට ලක් නොවූවත් දකුණු, වයඹ හා උතුරු ප්‍රදේශ වල මුහුදු ප්‍රදේශ වෙත සිදු විය හැකි බලපෑම් පිළිබඳව නිරන්තරයෙන් අවධානයෙන් පසු විය.

- මෙතෙක් ධීවර කටයුතු අත්හිටුවා තිබූ මීගමුව කලපුවේ ධීවර කටයුතු 2021.06.12 වෙනි දින සිට නැවත ආරම්භ කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

- තාවකාලික සහනයක් සැලසීම සඳහාමෙම පවුල්වලට රජය විසින් , එක් පවුලකට රුපියල් 5000 ක දීමනාවක් ජුනි මස ලබා දීමට අදාල දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් පියවර ගන්නා ලදී .

- ධීවර කාර්මිකයින් සඳහා වන්දි ලබා දීම අදාල කමිටු නිර්දේශ සහිත ප්‍රතිලාභින් සඳහා ඔවුන්ගේ බැංකු ගිණුම් වල තැන්පත් කරන ලදි.

වගුව **04** :ලබා දූන් වන්දි ප්‍රමාණය

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභි සක්‍රිය ධීවර කාර්මිකයින් සංඛ්‍යාව | ලබා දූන් වන්දි ප්‍රමාණය රුපියල් මිලියන |
|---|---|---|
| මීගමුව | 8,677 | 157.005 |
| කොළඹ | 2,859 | 54.7125 |
| කළුතර | 693 | 13.825 |
| **එකතුව** | **12,229** | **225.5425** |

- ආශ්‍රිත සේවා සඳහා වන්දි ප්‍රදාන කටයුතු පිළිබඳ අවදානය යොමු කර ඒ සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගනිමින් පවතින අතර ධීවර අම්පන්න වලට හානි සිදු වූ ධීවරයින් සඳහා ආම්පන්න ලබා දිමේ වැඩසටහන ක්‍රියාත්මක විය

- රටෙහි පවතින වසංගත තත්වය මත අදාල කටයුතු වෙත විවිධ බලපෑම් සිදු වූ අතර අපගේ නිලධාරීන් මෙම සිද්ධියට අදාලව කොවිඩ් උවදුරට ලක් වීමට පවා සිදු විය .**New X Press Pearl භාණ්ඩ ප්‍රවාහන නෞකාව ධීවර වන්දි ගෙවීමේ කටයුතු වල නිරත වී සිටියදී** අපගේ කොළඹ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ වරයා ජීවිතයෙන් සමු ගැනීම ධිවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව පත් වූ අවාසනාවන්ත තත්වයකි.

තහනම ක්‍රියාත්මක වන මුළු ප්‍රදේශය වර්ග කිලෝමීටර් ක් 459 පමණ වේ .මෙම තහනම් ප්‍රදේශය නම් කර ඇත්තේ ධීවරයින්ගේ ආරක්ෂාව සැලකිල්ලට ගෙනය .එම කලාපයෙන් බැහැර ප්‍රදේශයන්හි ධීවර කටයුතු කිරීමට බාධාවක් නොමැති අතර ඊට අමතරව මෙම ප්‍රදේශය තවදුරටත් අඩු කිරීම සම්බන්ධයෙන් නාරා ආයතනය අධ්‍යයනයන් කරමින් සිටියි.




තහනමට ලක් වූ පෙදෙස





අගමැතිතුමාගේ නිරීක්ෂණය





# නැව ගිනි ගැනීම හේතුවෙන් ආදායම් අහිමි වූ ධීවරයන්ට වන්දි දීම පිළිබඳව සාකච්ඡාවක්



**නිපුනි - ඒකනායක**

ගිනිගත් එක්ස්ප්‍රස් පර්ල් (XPress Pearl) නෞකාවෙන් ධීවර කටයුතු කිරීමට නොහැකි තහනම් කලාපයක් ලෙස පවතින මුහුදු කලාපයේ ධීවරයන් වෙනුවෙන් වන්දි මුදල් ලබා දීමේ ප්‍රගතිය පිළිබඳ එම කමිටුවේ සාමාජිකයන් වන ධීවර අමාත්‍යාංශයේ සහ ධීවර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කතෝලික සභාවේ පියතුමන්ලා සහ එම ධීවර සංවිධාන නියෝජිතයන් සමඟ පසුගියදා රාජ්‍ය ඇමැති කංචන විජේසේකරගේ ප්‍රධානත්වයෙන් මාර්ගගත ක්‍රමය හරහා සාකච්ඡාවක් පැවැත්විණි.

පසුගිය දින වන විට එම කලාපයේ ධීවර කටයුතු සිදුකරන අදායම් අහිමි වූ ධීවර යාත්‍රා හිමියන් සහ කාන්තාවන් 12,111ක් වෙනුවෙන් වන්දි මුදල් ඔවුන්ගේ බැංකු ගිණුම් වෙත බැර කර ඇත.

ඉදිරි අදියර ලෙස වක්‍රව අදායම් අහිමි වූ ධීවර කර්මාන්තයේ පාර්ශ්වකරුවන් වෙත වන්දි ලබා දීමේ කටයුතු ක්‍රියාත්මක වේ.

වන්දි දීම සඳහා පැවති සාකච්ඡාව










# බස්නාහිර ධීවරයන් 16,000කට ගිලුණු නැවෙන් මිලියන 420ක්

## මූලික වන්දියේ පළමු කොටස දෙයි



# 03

# නෝර්ත්සී ලිමිටඩ්















## දැක්ම

ඉහළ මත්ස්‍ය අස්වැන්නක් නෙලා ගැනීම අරමුණු කර දේශීය ධීවර කාර්මිකයින් ගේ අවශ්‍යතා පිරිමසමින් උසස් ප්‍රමිතියකින් යුත් මාළු දැල් හා ධීවර ආම්පන්න සපයමින් ධීවර ක්ෂේත්‍රයට අග්‍රගණ්‍ය දායකත්වයක් සපයන්නා බවට පත්වීම.

## මෙහෙවර


ධීවර කටයුතු ප්‍රවර්ධනය කිරීම හා රටේ මත්ස්‍ය නිෂ්පාදනයේ කාලීන ඉල්ලුම සපුරාලන උසස් ප්‍රමිතියකින් යුත් මාළු දැල් හා වෙනත් ධීවර ආම්පන්න නිෂ්පාදනය කිරීම හා සැපයීම.

## අරමුණු

- මාළු දැල් නිෂ්පාදනය තුලින් ධීවරයන්ට සේවය සැලසීම.
- ඉහළ ප්‍රමිතියෙන් යුතු මාළු දැල් හා වෙනත් ධීවර උපාංග නිපදවීම මගින් ධීවර ප්‍රජාවගේ කාලීන ඉල්ලුම සැපිරීම.
- ඔවුන්ගේ අවශ්‍යතාව අනුව විශේෂිත දැල් වර්ග නිෂ්පාදන මගින් පන්න ක්‍රම පහසුකර කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට දායකවීම.
- මාළු දැල් හා ධීවර ආම්පන්න මෙන්ම ධීවර කාර්මිකයින්ට අවශ්‍ය කරන නූල් වර්ග නිෂ්පාදන හා සැපයීම.

## ප්‍රතිපත්තිය

රටේ ආර්ථිකයට පෙරලා දායක වන ධීවර කාර්මිකයින්ගේ සුභ සාධනයට ප්‍රමුඛත්වය ලබා දෙමින්, රාජ්‍ය ආයතනයක් ලෙස, ව්‍යාපාර කටයුතු වල නිරත ගම් මට්ටමේ ධීවර සමුපකාර සමිති වලට සමාගම සියළු අවස්ථාවන් උදා කර දීම.



## ආයතනය

සීමාසහිත නෝත් සී ආයතනය යනු **භාණ්ඩාගාරයට සියයට සියයක හිමිකාරත්වය** ඇති 2001 ජූනි මස 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ පැවති පසුව 2007 අංක 7 දරණ නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරමින් පිහිටුවන ලද මාළු දැල් නිෂ්පාදනය කරන සමාගමකි.

සීමාසහිත නෝත්සී සමාගම සතුව **යාපනය ගුරුනගර් හි මාළු දැල් කර්මාන්තශාලාව** පමණක් තිබූ අතර, **කැබිනට් තීරණයකට අනුව 2010 නොවැම්බර් මස 02 වන දින, සීමාසහිත සීනෝර් පදනමට** (වර්තමානයේදී විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධනය, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයකි) අයත් වූ ලුණුවිල හා වීරවිල මාළු දැල් කර්මාන්තශාලා 2 හි හිමිකාරිත්වය සීමාසහිත නෝත් සී සමාගමට පවරන ලදී. ඒ අනුව එකී කර්මාන්තශාලා හි මෙහෙයුම් 2011 නොවැම්බර් මස සිට අරඹන ලදී.

වර්තමානයේ ආයතනයේ සමස්ථ සේවක සංඛ්‍යාව 259 ක්වේ. රැකියා ලබා දීම, ආදායම් ඉපයීම හා රට තුල මත්ස්‍ය නිෂ්පාදනයට සහය වෙමින් හා නිෂ්පාදන ක්‍රියාවලිය තුලින් රටේ ආර්ථිකයට දායකත්වයක් සැපයීමට සමාගම කටයුතු කිරීම සහ ධීවර කර්මාන්තයේ සමුද්‍රීය සහ මිරිදිය යන උප අංශ දෙකට අයත් ධීවර කර්මිකයින් 150,000 ක් පමණ (සෘජුව සහ වක්‍රව 250,000 කට අධික පිරිසක් හා ඔවුන්ගේ පවුල් මිලියන 01ක පමණ සංඛ්‍යාවක්) ධීවර කර්මිකයින්ගේ ජීවනෝපාය පවත්වා ගෙන යාම සඳහා වැදගත් කාර්යභාරයක් හොබවයි.

මාළු දැල් සඳහා වන ඉල්ලුම වසරකට මෙට්‍රික් ටොන් 4,743 ක් පමණ වන අතර ඉන් 47% ක් දේශීය නිෂ්පාදකයන් (වසරකට මෙට්‍රික් ටොන් 200-300 ධාරිතාවයක් කර්මාන්තශාලා 06 කින්) විසින් සපයන අතර, සීමා. නෝත් සී සමාගම දළ වශයෙන් වසරකට මෙට්‍රික් ටොන් 720 ක ධාරිතාවයක් නිෂ්පාදනය කරමින් මාළු දැල් ඉල්ලුමෙන් 5% ක් පමණ සපුරාලනු ලැබේ.

## මාළු දැල් සඳහා වන ඉල්ලුම

2015 වසරේ දී ක්‍රියාත්මක වූ බෝට්ටු ප්‍රමාණය පදනම් කරගෙන මත්ස්‍ය දැල් සඳහා වන ඉල්ලුම ඇස්තමේන්තු ගත කර ඇත. (මූලාශ්‍රය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව) එම ඉල්ලුම පහත පරිදි වේ

| No. | බෝට්ටු වර්ග | බෝට්ටු ප්‍රමාණය | ප්‍රමාණය. | බර - Kg | මුළු අගය Wt | මාළු දැල් සඳහා ඇති ඉල්ලුම (Kgs) |
|---|---|---|---|---|---|---|
| 1 | බහුදින යාත්‍රා | 4,218 | 20 | 7.5 | 150 | 632,700 |
| | | 4,218 | 20 | 5 | 100 | 421,800 |
| 2 | IBM - එක් දින බෝට්ටු | 719 | 20 | 7.5 | 150 | 107,850 |
| | | 719 | 20 | 3 | 60 | 43,140 |
| 3 | OBM - FRP බෝට්ටු | 24,028 | 20 | 3 | 60 | 1,441,680 |
| | | 24,028 | 20 | 2 | 40 | 961,120 |
| 4 | OBM - සාම්ප්‍රදායික බෝට්ටු | 1,872 | 20 | 3 | 60 | 112,320 |
| 5 | යාන්ත්‍රික නොවන සාම්ප්‍රදායික බෝට්ටු | 21,189 | 20 | 2 | 40 | 847,560 |
| 6 | මිරිදිය බෝට්ටු | 8,778 | 10 | 2 | 20 | 175,560 |
| | **මාළු දැල් සඳහා මුළු ඉල්ලුම** | | | | | **4,743,730** |

බහුදින බෝට්ටු සහ ඕබීඑම්-එෆ්ආර්පීබී (පිටත ලෑලි මෝටර් ෆයිබර්ග්ලාස් ශක්තිමත් කරන ලද ප්ලාස්ටික් බෝට්ටු) වල ක්‍රියාකාරිත්වය ඉහළ යාම හේතුවෙන් දේශීය ඉල්ලුම ප්‍රධාන වශයෙන් වර්ධනය වී තිබේ. ලියාපදිංචි වී ඇති බෝට්ටු සංඛ්‍යාව අනුව මාළු දැල් සඳහා ඇති ඉල්ලුම දළ වශයෙන් වාර්ෂිකව මෙට්‍රික් ටොන් 4,743 ක් වේ. දේශීය නිෂ්පාදකයින් මුළු ඉල්ලුමෙන් දළ වශයෙන් 47% ක් සපයන අතර, ආනයනික මාළු දැල් මුළු ඉල්ලුමෙන් 40% ක් සඳහා දායක වන අතර, ඉල්ලුමෙන් 13% ක සම්පූර්ණ නොකල සැපයුම් පරතරයක් පවතියි.

## දේශීය නිෂ්පාදකයින්

| අං. | සැපයුම්කරුගේ නම | පිහිටීම |
|---|---|---|
| 01 | සීමා. නෝත් සී සමාගම | යාපනය, ලුණුවිල, වීරවිල |
| 02 | සීමා. මල්බා ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම | ජා ඇල |
| 03 | සීමා. ජේ.බී. බ්‍රදර්ස් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම | කොළඹ |
| 04 | සීමා. සදාසරණ (පුද්.) සමාගම | හලාවත |
| 05 | සීමා. නෙෆාඩ් ෆවුන්ඩේෂන් | යාපනය |
| 06 | සීමා. රාජා ෆිෂ්නෙට් (පුද්.) සමාගම | ඕමාන්තේ |
| 07 | සීමා. එෆ්.බී.එස්. පුද්. සමාගම | හම්බන්තොට |

## දේශීය ප්‍රධාන ආනයනකරුවන්

| No | ආනායනකරුගේ නම |
|---|---|
| **01** | ලාෆීර් ඇන්ඩ් සන්ස් |
| **02** | සීමා. එෆ්.බී.එස්. පුද්. සමාගම |
| **03** | ජේ.බී. ප්‍රනාන්දු සහ පුත්‍රයෝ |

## කර්මාන්තශාලාවල සමස්ත මාළු දැල් නිෂ්පාදන ධාරිතාවය

| අං. | විස්තරය |ගුරුනගර් | ලුණුවිල | වීරවිල | එකතුව |
|---|---|---|---|---|---|
| 01. | සමස්ත නිෂ්පාදන ධාරිතාවය - වාර්ෂිකව(මෙ.ටො) | 300 | 240 | 180 | 720 |



නොර්ත් සී ආයතනයේ ලුණුවිල පිහිටි මාළු දැල් නිපදනවන කර්මාන්ත ශාලාව ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්දා අමාත්‍යතුමාගේ නිරීක්ෂණයට ලක් වේ.



නොර්ත් සී ආයතනයේ නිෂ්පාදන කාර්යක්ෂමතාතය වැඩිකිරීම සඳහා ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්දා අමාත්‍යතුමා හා නිලධාරීන් අතර පැවති සාකච්ඡාව

## ස්ථාවර ප්‍රාග්ධනය

**ඉඩම් හා ගොඩනැගිලි**

ලුණුවිල කර්මාන්තශාලාව පවත්වාගෙන යනු ලබන ඉඩම ආයතනය සතු එකක් වන අතර වීරවිල හා යාපනය කර්මාන්තශාලා පහත විස්තර කර ඇති වෙනත් රජයේ ආයතන සතු ඉඩම් වල ස්ථාපිත කර ඇත.

| අං. | ස්ථානය/දිස්ත්‍රික්කය | ඉඩමේ ප්‍රමාණය (පර්චස්) | ගොඩනැගිලි ඉඩ ප්‍රමාණය(ව.අ) | ඉඩමේ අයිතිය |
|---|---|---|---|---|
| 01. | ගුරුනගර් - (යාපනය) | 350 | 16,220 | රජයේ |
| 02. | ලුණුවිල - (පුත්තලම) | 568 | 25,539 | ආයතනය සතු |
| 03. | වීරවිල -(හම්බන්තොට) | 137 | 15,000 | රාජ්‍ය ආයතනය- වී අලෙවි මණ්ඩලය |

## නිෂ්පාදනය සහ මෙහෙයුම් පහසුකම්

කර්මාන්තශාලා සතුව ඇති දැල්, ඇඹරුම් සහ සැකසුම් යන්ත්‍ර වල විස්තර පහත දක්වා ඇත.

| අං. | විස්තරය | නිෂ්පාදනය කළහැකි දැල් වර්ගය | ගුරුනගර් | ලුනුවිල | වීරවිල |
|---|---|---|---|---|---|
| ***a.*** | ***Netting Machinery*** | | | | |
| 01. | Amita 6mm pitch | 2-6 ply | 01 | - | - |
| 02. | Amita 7mm pitch | 2-9 ply | 02 | 05 | 04 |
| 03. | Amita 9mm pitch | 9-15 ply | 01 | 01 | 01 |
| 04 | Amitech 7mm pitch | 4-6 ply | - | - | 02 |
| 05. | Amita 11mm pitch | 12-24 ply | 01 | - | 01 |
| 06. | Amita 14mm pitch | 24-36 ply | 01 | 03 | - |
| | **Total** | | **06** | **09** | **08** |
| | Total Annual production capacity | | 300Mt. | 240Mt. | 180Mt. |

| අං. | විස්තරය | නිෂ්පාදනය කල හැකි දැල් වර්ගය | ගුරුනගර් | ලුනුවිල | වීරවිල |
|---|---|---|---|---|---|
| ***b.*** | ***Twisting Machineries*** | | | | |
| 01. | Lezzani | 2-9 ply | | 02 | |
| 02. | Collins | 15-27 ply | | 01 | |
| 03 | Amitech | 12-36 ply | | 01 | |
| 04 | Jmw | 15-60 ply | 01 | 0 | |
| 05 | Jmw | 2-9 ply | 01 | 0 | |
| | **Total** | | **02** | **04** | |
| | Annual production capacity | | 200 Mt | 120 Mt | |
| ***c.*** | ***Processing Machinery*** | | Available | Available | Not Available |

## මාළු දැල් නිෂ්පාදනය හා අලෙවිය


**(2021 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා)**

| කර්මාන්තශාලාව | නිෂ්පාදනය (මෙ.ටො) | | විකුණුම් (රු.මි) | |
|---|---|---|---|---|
| | ඉලක්කගත නිෂ්පාදනය | ලඟාකරගත් නිෂ්පාදනය | ඉලක්කගත විකුණුම්(රු.මි) | ලඟාකරගත් විකුණුම්(රු.මි) |
| ගුරුනගර් | 135.00 | 55.26 | 180.00 | 61.94 |
| ලුණුවිල | 108.00 | 46.02 | 135.00 | 76.52 |
| වීරවිල | 72.00 | 27.50 | 72.00 | 52.87 |
| එකතුව | **315.00** | **128.78** | **387.00** | **191.33** |



## නිෂ්පාදන ක්‍රියාදාමය

මාළු දැල් නිෂ්පාදනයේ වසර 30 කට වැඩි පළපුරුද්දක් සහිත වූ අයගෙන්ද සැදුම් ලත් තාක්ෂණික කාර්ය මණ්ඩලයක් කර්මාන්තශාලා වල ඇත.



# ලුනුවිල කර්මාන්තශාලාව





# වීරවිල කර්මාන්තශාලාව





# යාපනය කර්මාන්තශාලාව







## Net Machine Model MSB 9-50







**Depth Stretch Machine, Dye Plant with hoist, Heat Length Stretching Machine, Centrifugal Separator**










## Net Machine Model MSB 7 – 60, Primary ring twisting machine





# Cable ring twisting machine, Precision cross winder












## ආර්ථික හා සමාජ සංවර්ධනය

සමාගමේ ඉලක්කගත වෙළෙඳපොළ කොටස 13.47% ක් වන අතර එමගින් ධීවර ප්‍රජාවට උසස් තත්ත්වයේ මත්ස්‍ය දැල් සාධාරණ මිලකට ලබා ගත හැකි අතර එමගින් ධීවර කටයුතුවල නියැලීමට සහ ඔවුන්ගේ ඉපැයීම් ධාරිතාව සහ තිරසාරභාවය ඉහළ නැංවීමට හැකි වේ.

මත්ස්‍ය දැල් නිෂ්පාදනය  මගින් පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා තෘප්තිමත් කිරීමට සහ ධීවර ප්‍රජාවගේ සුභසාධනය ඉහළ නැංවීම සඳහා අස්වැන්න වැඩි කිරීම සහ ඒ ආශ්‍රිත මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවිය හැකිය.

මත්ස්‍ය දැල් නිෂ්පාදනය ධීවරයින්ගේ ජීවිත පොහොසත් කරන අතර පාරිභෝගික අවශ්‍යතා සපුරාලමින් ඔවුන්ගේ සුභසාධනය සඳහා අවශ්‍ය ආදායම උපයා ගැනීමට හැකි වන අතර එමගින් ජාතික ආදායම හා දළ දේශීය නිෂ්පාදනය ඉහල නංවමින් රටේ ආර්ථිකයට දායක වනු ඇත.



# 04
# ධීවර අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති















# වෙල්ලමන්කර ධීවර වරාය ඉදිකිරීම




1. ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය :

   මෙම ව්‍යාපෘතිය මගින් පහත දැක්වෙන අයිතමයන් ඉදිකිරීම සිදු කරයි.

   - දියකඩනය ඉදිකිරීම (මීටර 567 )
   - බාදන වාරකය (Groyne) ඉදිකිරීම (මීටර 125)
   - වේදිකාව ඉදිකිරීම (මීටර 350)
   - වෙරළ පහසුකම් (Shore facilities)

     මත්ස්‍ය වෙන්දේසි ශාලාව, දැල් සැකසුම් මධ්‍යස්ථානය, ආපනශාලා, සනීපාරක්ෂක පහසුකම් වෙන්දේසි ශාලාව, සාප්පු ගොඩනැගිල්ල, කාර්ය මණ්ඩල නේවාසිකාගාරය, ධීවර පරීක්ෂක හා වෙරළාරක්ෂක බලකාය සඳහා කාර්යාල නවාතැන් පහසුකම් සහ වතුර ටැංකි ඉදිකිරීම සිදු කරයි.

2. ව්‍යාපෘති ආරම්භය: 2018.06.25
3. ව්‍යාපෘති අවසානය (අපේක්ෂිත) : 2022.02.28
4. ව්‍යාපෘති වටිනාකම : රු.මි. 2,498
5. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය :

| අවුරුද්ද | මූල්‍ය ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි. |
|---|---|---|
| 2018 | 500 | 342.95 |
| 2019 | 800 | 638.9 |
| 2020 | 719.8 | 709.13 |
| 2021 (2021.08.31 දිනට) | 350 | 292.09 |

6. භෞතික ප්‍රගතිය : වෙල්ලමන්කර ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘතියේ 2021.08.31දිනට භෞතික ප්‍රගතිය 98.5% කි.




2021/9/14 12:08


2021/9/14 12:07


2021/9/14 12:06






2021/9/14 11:50


2021/9/14 11:58

# ගන්දර ධීවර වරාය ඉදිකිරීම



1. ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය :

මෙම ව්‍යාපෘතිය මඟින් පහත දැක්වෙන අයිතමයන් ඉදිකිරීම සිදු කරයි.

- දියකඩනය ඉදිකිරීම (මීටර 257 )
- වේදිකාව ඉදිකිරීම (මීටර 175.63 , 221.12 හා 127 )
- වෙරළ පහසුකම් (Shore facilities)

  මත්ස්‍ය වෙන්දේසි ශාලාව, දැල් සැකසුම් මධ්‍යස්ථානය, ආපනශාලා, සනීපාරක්ෂක පහසුකම්, සාප්පු ගොඩනැගිල්ල, කාර්ය මණ්ඩල නේවාසිකාගාරය, ධීවර පරීක්ෂක හා වෙරළාරක්ෂක බලකාය සඳහා කාර්යාල, නවාතැන් පහසුකම්, පොම්පාගාර, කසළ එකතු කිරීමේ ස්ථානය, කිරුම් ස්ථානය, තෙල් සැපයීම් කටයුතු සහ වතුර ටැංකි ඉදිකිරීම සිදු කරයි

2. ව්‍යාපෘති ආරම්භය: 2020.12.07
3. ව්‍යාපෘති අවසානය: 2023.12.06
4. ව්‍යාපෘති වටිනාකම : රු.මි. 9,360
5. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය :

| අවුරුද්ද | මූල්‍ය ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි. | සටහන |
|---|---|---|---|
| 2020 | 408 | 202.48 | |
| 2021 (2021.08.31 දිනට) | 1,590 | 1,005.74** | **රු.මි. 532 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අත්තිකාරම් ලෙස ගෙවා ඇත |

6 .භෞතික ප්‍රගතිය :

ගන්දර ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘතියේ 2021.08.31දිනට අපේක්ෂිත භෞතික ප්‍රගතිය 11% වූ අතර එහි භෞතික ප්‍රගතිය 9% කි.










## කලමැටිය ධීවර වරාය ඉදිකිරීම

කලමැටිය ධීවර වරාය ඉදිකිරීම 2014.07.14 වන දින ආරම්භ කරන ලද අතර, දැනට මෙම ව්‍යපෘතියේ භෞතික ප්‍රගතිය 100%ක් වේ.මෙම ව්‍යාපෘතියේ මූලික වටිනාකම රු.මි. 1,280.79 කි.










මෙම ධීවර වරායේ මූලික කොන්ත්‍රාත්තුවේ නොමැති එහෙත් මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වැඩවලට අදාළ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.

# බලපිටිය ධීවර වරාය ඉදිකිරීම




1. ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය :

මෙම ව්‍යාපෘතිය මඟින් පහත දැක්වෙන අයිතමයන් ඉදිකිරීම සිදු කරයි.

- දියකඩනය ඉදිකිරීම (මීටර 418)
- දියකඩනය ඉදිකිරීම (උතුරු) (මීටර 125)
- වේදිකාව ඉදිකිරීම (මීටර 125)
- වෙරළ පහසුකම් (Shore facilities)

  මත්ස්‍ය වෙන්දේසි ශාලාව, දැල් සැකසුම් මධ්‍යස්ථානය, ආපනශාලා, සනීපාරක්ෂක පහසුකම් වෙන්දේසි ශාලාව, සාප්පු ගොඩනැගිල්ල, කාර්ය මණ්ඩල නේවාසිකාගාරය, ධීවර පරීක්ෂක හා වෙරළාරක්ෂක බලකාය සඳහා කාර්යාල නවාතැන් පහසුකම් සහ වතුර ටැංකි ඉදිකිරීම සිදු කරයි

2. ව්‍යාපෘති වටිනාකම : රු.මි. 1,200

3. ප්‍රගතිය : ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇත. පාරිසරික බලපෑම් වාර්තාව සඳහා අනුමැතිය ලැබූ පසු ඉදිකිරීමට අදාළ බලපත්‍රය ලබා ගැනීමට නියමිතය.

## මීගමු කලපුව සංවර්ධනය කිරීම

ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය:

මෙම ව්‍යාපෘතිය අදියර 3ක් යටතේ ක්‍රියාත්මක වේ. එහි දී, අදියර I යටතේ ක්‍රියාත්මක පැකේජ ගණන 7 කි. ව්‍යාපෘතියේ අදියර I හි පැකේජ 7 සඳහා මුළු මුදල රු.මි. 1,000 කි.එනම්,

1. පැකේජ I - ලෙල්ලම ප්‍රදේශයේ කලපු සංවර්ධනය

   එහි දී, ලෙල්ලම වැඩබිමෙහි පැකේජ I යටතේ බෙසම හැරීම 2016.05.14 වන දින වැඩ ආරම්භ කරන ලද අතර, 2017.02.14 වන දින ව්‍යාපෘතිය අවසන් කරන ලදී.

2. පැකේජ II - උසාවි සංකීර්ණය අසල ප්‍රදේශයේ කලපුව සංවර්ධනය කිරීම

   පැකේජ II යටතේ අධිකරණය අසල කලපුව හැරීම 2017.08.01 වන දින ආරම්භ කරන ලද අතර, 2017.02.14 වන දින ව්‍යාපෘතිය අවසන් කරන ලදී.





3. පැකේජ III - රැජින මාර්ගය ප්‍රදේශයේ කලපු සංවර්ධනය

   පැකේජ III යටතේ රැජින පාර අසල කලපුව හැරීම 2018.07.20 වන දින ආරම්භ කරන ලද අතර. මේ වන විට එහි භෞතික ප්‍රගතිය 90% ක් වේ.

   a) ප්‍රමාදවීමට හේතූන්

      ව්‍යාපෘතියේ 3 වන අදියර ක්‍රියාත්මක කිරිමේදී, කලපු රොන්මඩ ඉවත් කර ඒවා වියලෙන තෙක් ව්‍යාපෘති සීමාවෙහි තැන්පත් කර තැබීම නිසා කඩොලාන පරිසරයට හානි සිදු කිරිමක් ලෙස දක්වා වන සංරක්ෂණ ආ .ප . 20 (1) වෙනි වගන්තිය යටතේ නඩු පවරා ඇත.

(ව්‍යාපෘතියේ 3 වන අදියර) කලපු රොන්මඩ ඉවත් කර ඒවා වියලෙන තෙක් ව්‍යාපෘති සීමාවෙහි තැන්පත් කර ඇති පස් කර මීගමුව පොලිසිය නිසි ආරක්ෂාව ලබා දුන් පසු නැවත ආරම්භ කිරිමට නියමිතය.)

4. පැකේජ IV - ලෙල්ලම ප්‍රදේශයේ කලපු සංවර්ධනය

ලෙල්ලම වැඩබිමෙහි පැකේජ IV යටතේ බෙසම හැරීම 2019.03.26 වන දින වැඩ ආරම්භ කරන ලද අතර, මේ වන විට එහි භෞතික ප්‍රගතිය 100% ක් වේ.







5. පැකේජ V - ලෙල්ලම ප්‍රදේශයේ ජැටිය ඉදිකිරීම

පැකේජ V යටතේ මීටර 15 පළල මීටර 265 ක් දිග ජැටිය ඉදිකරනු ලබයි. මේවන විට කොන්ත්‍රාත් කරුවෙකු තොරා ගැනීම සඳහා ප්‍රසම්පදන කටයුතු සිදු කිරීමට නියමිතය.





6. පැකේජ VI - උසාවි සංකීර්ණය අසල ප්‍රදේශයේ ජැටිය ඉදිකිරීම


පැකේජ VI යටතේ මීටර 15 පළල මීටර 145ක් දිග ජැටිය ඉදිකරනු ලබයි. මේවන විට සැලසුම් සකස්කර අවසන් කර ඇති අතර, ලංසු කැඳවීම සඳහා ලංසු ලේඛනය සකස් කරමින් පවති.







# රැකව නැංගුරම්පල ඉදිකිරීම



1. ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය : 300m දිගැති දියකඩනය ඉදිකිරීම හා බාදන වාරකය (Groyne) ඉදිකිරීම
2. ව්‍යාපෘති ආරම්භය:2020.10.20
3. ව්‍යාපෘති අවසානය (අපේක්ෂිත) : 2022.01.31
4. ව්‍යාපෘති වටිනාකම : රු.මි. 380
5. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය :

| අවුරුද්ද | මූල්‍ය ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි. |
|---|---|---|
| 2020 | 81.5 | 65.42 |
| 2021 (2021.08.31 දිනට) | 200 | 97.16 |

6. භෞතික ප්‍රගතිය :

රූකව නැංගුරම්පල ඉදිකිරීම ව්‍යාපෘතියේ 2021.08.31දිනට භෞතික ප්‍රගතිය 56% කි.










# මාවැල්ල නැංගුරම්පල ඉදිකිරීම




1. ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය :

   260ම දිගැති දියකඩනය ඉදිකිරීම හා වෙරළාශ්‍රිත දියකඩනයන් 2ක් ඉදිකිරීම
2. ව්‍යාපෘති ආරම්භය:2020.10.20
3. ව්‍යාපෘති අවසානය (අපේක්ෂිත) : 2022.03.22
4. ව්‍යාපෘති වටිනාකම : රු.මි. 379.8
5. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය :

| අවුරුද්ද | මූල්‍ය ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි. |
|---|---|---|
| 2020 | 80.5 | 30.1 |
| 2021 | 200 | 48 |

6. භෞතික ප්‍රගතිය :

මාවැල්ල නැංගුරම්පල ඉදිකිරීම් ව්‍යාපෘතියේ අපේක්ෂිත භෞතික ප්‍රගතිය 55% වූ අතර එහි භෞතික ප්‍රගතිය 19% කි.










# ඉදිරියේදි ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති



| | ව්‍යාපෘතියේ නම | දිස්ත්‍රික්කය | ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය (රු. බි.) | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 1 | ගුරුනගර් ධීවර වරාය ඉදිකිරීම | යාපනය | 6.1 | වෙරළාශ්‍රිත විස්තරාත්මක සැලසුම් අවසන් කර ඇත. |
| 2 | පේසාලේ ධීවර වරාය ඉදිකිරීම | මන්නාරම | 6.0 | විස්තරාත්මක සැලසුම් අවසන් කර ඇත. |
| 3 | පුදුවකඩ්ඩු ධීවර වරාය ඉදිකිරීම | ත්‍රිකුණාමලය | 3.1 | ව්‍යාපෘති යෝජනාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යවා ඇත. |
| 4 | පාලච්චේනේ ධීවර වරාය ඉදිකිරීම | මඩකලපුව | 4.1 | ව්‍යාපෘති යෝජනාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යවා ඇත. |
| 5 | ප්‍රංශ රජය ආධාර යටතේ ගාල්ල, බේරුවල, පුරාණවැල්ල හා කුඩාවැල්ල ධීවර වරායන් සංවර්ධන කිරීම | ගාල්ල<br>කළුතර<br>මාතර<br>හම්බන්තොට | 23.5 | විස්තරාත්මක සැලසුම් සකස් කරමින් පවතී. |
| 6 | උතුරු පළාත් තිරසාර ධීවර සංවර්ධන ව්‍යාපෘතිය | යාපනය<br>මන්නාරම<br>මුලතිව්<br>කිලිනොච්චි | 32.0 | විස්තරාත්මක සැලසුම් අවසන් කර ඇත. |



හරිත වරාය සංකල්පය තුළින් සමුද්‍රීය කර්මාන්තයන්ගේ පරිසර හිතකාමී තිරසාර සංවර්ධනයක් කරා...